2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සමාජ සේවා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය:- 216

සමාජ සේවා දෙපාර්තමේන්තුව

දෙවන මහල

සෙත්සිරිපාය - II අදියර

බත්තරමුල්ල

දුරකථන - 0112187050

ෆැක්ස් - 0112186276

ඊ - මේල් - dirss@sltnet.lk

- dirssdss@gmail.com

වෙබ් අඩවිය - www.socialservices.gov.lk

පටුන

01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1	හැඳින්වීම	3 - 4
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	5
1.3	ප්‍රධාන කාර්යන්	6
1.4	සංවිධාන සටහන	7
1.5	සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින අංශ හා ආයතන	8-18
1.6	සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්	19-20
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	20

02 වන පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1	ආබාධ සහිත වූවන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහන	21-31
2.2	මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය හා සමාජ ගත කිරීමේ ව්‍යාපෘතිය	32-33
2.3	ජයග්‍රහණ	32-33
2.4	අභියෝග	34
2.5	ඉලක්ක	34-35

03 වන පරිච්ඡේදය - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	36-37
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	38
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	39-40
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	40
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	40
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	41
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	41
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	41
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	42-61

04 වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	62

05 වන පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1	හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු (SDG)	63-64
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	64

06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	65-66
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය	66-67
6.3	මානව සම්පත් සංවර්ධනය	67-70

07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

7.1	අනුකූලතා වාර්තාව	71-76

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ සමාජ සේවා විෂයභාර ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කරනු ලබයි.

ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් යුතුව සමාජ සේවා දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි. දෙපාර්තමේන්තු මෙහෙවරට අනුගත වෙමින් 2021 වර්ෂයට ලැබී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හඳුනාගත් විවිධ වැඩසටහන් සැලසුම් සහගතව බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා ක්‍රියාත්මක කොට ඇත. ඒ අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් 2021 වර්ෂයේ සිදුකරන ලද ක්‍රියාකාරකම් වලට අදාළ සමස්ත තොරතුරු මෙහි අන්තර්ගත වේ.

විශේෂයෙන්ම ආබාධ සහිත ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික යහ පැවැත්ම සුරක්ෂිත කරමින් ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගැනීම උදෙසා වැඩසටහන් රාශියක් සිදු කරන අතර, ඒ අතුරින් ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව සතු වෘත්තීය පුහුණු ආයතන සුවිශේෂී සේවාවක් ඉටුකරනු ලබයි. විශේෂයෙන් ආබාධ සහිත තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද සුභසාධන වැඩසටහන් තුළ සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආබාධ සහිත ප්‍රජාව සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීමේ අරමුණින් ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන ජාතික වැඩසටහන (CBR) විධිමත් ක්‍රමවේදයන් අනුව සැලසුම් සහගතව ක්‍රියාත්මක වේ. මෙහි නව අංගයක් ලෙස දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමක් සිදු කෙරෙන අතර, ඒ යටතේ ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛ ව්‍යාපෘතියක් වන්නේ ආබාධ සහිත ප්‍රජාවගේ නිෂ්පාදන අලෙවිය සඳහා නවතම සන්නාමයක් සහිතව වෙළඳපොළ ඉඩප්‍රස්ථාවන් හඳුන්වා දීමයි.

මුල් ළමාවියේදීම ළමුන්ට ඇතිවන කායික හා මානසික ගැටළු අවම කිරීම සඳහා කල් ඇතිව මැදිහත් වී අවශ්‍ය සේවා පහසුකම් සැපයීමට අදාළව මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හරහා ආබාධ සහිත ළමුන්ගේ සුබසාධනය උදෙසා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කොට ඇති ප්‍රධානතම වැඩසටහනකි. ඒ යටතේ මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම මෙන්ම ඔවුන් සමාජගත කිරීමත්, ප්‍රාදේශීය මට්ටමින් ජනතාව දැනුවත් කිරීමේ මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීමත් හරහා රටේ අනාගත පරපුරේ සුභ සිද්ධිය උදෙසා ළමා හා තරුණ ප්‍රජාව මතින් මුදවා ගැනීමට සුවිශාල දායකත්වයක් සපයයි.

ඉලක්ක ගත ප්‍රජාවගේ ආර්ථික සාමාජීය මෙන්ම සංස්කෘතික සංවර්ධනයක් උදෙසා ජාතික වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අතුරින් ''සිත්රූ'' ජාතික කලා ප්‍රසංගය, ආබාධ සහිත තැනැත්තන්ගේ ස්වශක්ති සංවිධාන ඇගයීම සඳහා වන ''ස්වාභිමානී'' සම්මාන ප්‍රදානෝත්සවය ස්වශක්ති අභිමානි ජාතික වැඩසටහන, ''ආබාධ සහිත වූවන්ගේ ජාතික ආධුනික මලල ක්‍රීඩා උළෙල'', ''ජාත්‍යන්තර සුදුසැරයටි සැමරුම් දින උළෙල'' හා ''ආබාධ සහිත ළමුන්ගේ බක්මහ උළෙල'' මුල් තැනක් ගනී. මෙම වැඩසටහන් තුළින් දිවයිනේ සෑම ප්‍රදේශයකම විසිරී සිටින ආබාධ සහිත ප්‍රජාවගේ හැකියා හා කුසලතා වර්ධනයත්, වෘත්තීය පුහුණු අභ්‍යාසලාභීන් හා ඔවුන්ගේ දෙමාපියන්, කාර්ය මණ්ඩලය හා සෙසු සාමාජිකයින් අතර අන්‍යොන්‍ය සුහදතාව, අවබෝධය හා විශ්වසනීයත්වය වර්ධනය කිරීමත් අපේක්ෂා කෙරේ.

එසේම දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අනුගත වෙමින් සියලුම සංවර්ධන වැඩසටහන් සාර්ථක කරගැනීමට දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ, දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනවලට අනුයුක්ත නිලධාරීන්ගේ හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායීතාව හා අධ්‍යාත්මික සංවර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු, වැඩමුළු, සම්මන්ත්‍රණ හා පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම ද සිදු කරනු ලබයි.

ගෝලීය වසංගතයක් වන Covid 19 වසංගත තත්ත්වය හමුවේ 2021 වර්ෂයේදීත් වරින් වර නිරෝධායන ඇඳිරිනීතිය බලපැවැත්වුණු අතර, නිරෝධායන ඇඳිරිනීතිය ඉවත් කිරීමෙන් පසුව ද අවම කාර්ය මණ්ඩලයක් යටතේ රාජකාරී කටයුතු පවත්වාගෙන යාමට සිදු විය. එමෙන්ම මේ තත්ත්වය හමුවේ සෞඛ්‍ය අංශ වෙතින් ඉදිරිපත් කරනු ලැබූ මාර්ගෝපදේශයන්ට අනුව පුද්ගල ඒකරාශි කිරීම් යටතේ සිදුකරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති ද සීමා සහිත විය. ඒ අනුව වාර්ෂිකව දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කර පවත්වනු ලබන ජාතික මට්ටමේ වැඩසටහන් එපරිද්දෙන්ම සිදු කිරීමට බාධා එල්ලවන ලදි.

එකී බාධා මධ්‍යයේ උවද 2021 වසර තුළ සේවාලාභී සුභසාධනය උදෙසා සිදු කරනු ලැබූ සියලු වැඩසටහන්, ව්‍යාපෘති තුළින් ඉහළ කාර්ය සාධනයක් අත්කර ගැනීමට හැකියාව ලැබුණු අතර, ඒ සම්බන්ධ අදාළ තොරතුරු හා වැය ශීර්ෂ 216 යටතේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය මේ තුළ අන්තර්ගත වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"2030 වන විට ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය තහවුරු වූ සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ පුරෝගාමියා වීම "

මෙහෙවර

"ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදිමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව,කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම , ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම "

අරමුණු

- වයස අවුරුදු 16 - 35 අතර ආබාධ සහිත තරුණ තරුණියන් ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් හා බාහිර ක්‍රියාකාරකම් සවිබලගැන්වීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන් සඳහා නේවාසික රැකවරණය ලබාදීම.
- වයස අවුරුදු 0 -16 අතර විවිධ ආබාධවලින් පෙළෙන ළමුන්ගේ ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත්වීම.
- ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම හා ඔවුන් සවිබලගැන්වීම .
- සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන සවිබල ගැන්වීම.
- මතට ඇබ්බැහිවූවන් නේවාසික පුනරුත්ථාපනය කිරීම, ඔවුනට වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.
- විවිධ සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම.
- ශ්‍රව්‍යාබාධිත තැනැත්තන් සඳහා ශ්‍රව්‍යාබාධිත හැඳුනුම්පත් ලබා දීම.
- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට ගෙන ඒම.

1.3 ප්‍රධාන කාර්යන්

- ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත වෙළඳපොළ රැකියා වෙත යොමු කිරීම.

- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනාගැනීම හා පුළුල් කිරීම.

- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනීම හා පර්යේෂණ කිරීම.

- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.

- ශ්‍රව්‍යාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රව්‍යාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.

- භාරකරුවන් අභිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා ජීවිත කාලය පුරා රැකවරණය සැපයීම.

- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම

- වයස අවු. 60 ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රීඩා ,අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබා දීම, ඔවුන්ගේ ආයතන සඳහා යටිතල පහසුකම් සැපයීම හා වෙනත් සුභසාධන කටයුතු.

- ප්‍රජා මූලික පුනරුත්ථාපන සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා සැපයීම.

- ප්‍රාදේශිය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.

- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු, සම්මන්ත්‍රණ වැඩසටහන් හා වැඩමුළු සඳහා යොමු කිරීම.

1.4 සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ හා ආයතන



1.5.1 දෙපාර්තමේන්තුවට අයත් අංශ

1.5.1.1 පාලන අංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමවත්, ඵලදායීවත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පාලන අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි.

එහිදී මානව හා භෞතික සම්පත් කළමනාකරණ කටයුතු, ආයතනික හා පරිපාලනමය කටයුතු සිදුකිරීමත්, ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමත්, දෙපාර්තමේන්තුවේ සියලු අංශයන් සඳහා සහාය සේවාවන් සැපයීමටත් අදාළව පාලන අංශය මගින් පහත සඳහන් කාර්යයන් සිදුකරනු ලබයි.

- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු හා දෙපාර්තමේන්තුවේ තැපෑල පිළිබඳ කටයුතු.
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා නිළධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, වැටුප් වර්ධක ගෙවීම, ස්ථානමාරු හා විශ්‍රාම ගැන්වීම ආදි පෞද්ගලික ලිපි ගොනුවලට අදාළ සියලුම කටයුතු.
- සේවා අවශ්‍යතාවය මත නව තනතුරු අනුමත කරගැනීම, බඳවා ගැනීම් පරිපාටි සැකසීම, කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම ආදී රාජකාරී කටයුතු.
- කාර්ය මණ්ඩලයේ නිවාඩු, දුම්රිය බලපත්‍ර, අතිකාල දීමනා, ආපදා ණය, දේපළ ණය ලබාදීමට අදාළ කටයුතු.
- අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාල රාජකාරී, නිවාස කුලී අයකරගැනීමට අදාළ රාජකාරි, විදේශ ශිෂ්‍යත්ව, විදේශ පුහුණු හා තොරතුරු පනත ක්‍රියාත්මක කිරීමට අදාළ රාජකාරි කටයුතු.
- කාර්යාල නියෝග ඉදිරිපත් කිරීම, දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා දෙපාර්තමේන්තුව සඳහා උපදෙස් නිකුත් කිරීම. අනෙකුත් රාජ්‍ය ආයතන වෙතින් නිකුත් කරන ලද චක්‍රලේඛ ලබාගෙන, චක්‍රලේඛ ලිපිගොණු යාවත්කාලීන කර පවත්වාගෙන යාම හා එහි සඳහන් කරුණු ක්‍රියාවට නැංවීම.
- දෙපාර්තමේන්තුවේ විදුලිය, දුරකථන, අන්තර්ජාල, ආරක්ෂක සේවා වියදම්, පිරිසිදු කිරීම් සේවා වියදම්, පුවත්පත් වියදම් සඳහා වන බිල්පත් ගෙවීම් හා දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර, උපකරණ අළුත්වැඩියා කිරීමට අදාළ කටයුතු.

1.5.1.2 සංඥා භාෂා අංශය

ශ්‍රව්‍යාබාධිත හා අර්ධ ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් සඳහා අධ්‍යාපනික, සමාජයීය, සංස්කෘතික සේවාවන් සැපයීමට මෙන්ම වෛද්‍ය සෞඛ්‍ය හා නෛතික පහසුකම් සැපයීම සඳහා ද සන්නිවේදන මාධ්‍ය වනුයේ සංඥා භාෂාවයි. මෙම සංඥා භාෂාව භාෂාවක් ලෙස පිළිගැනීමට 2010.09.05 දිනැතිව අමාත්‍ය මණ්ඩලය ප්‍රතිපත්තිමය තීරණයක් ද ගෙන ඇත.

සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම වෙනුවෙන් දැනට දෙපාර්තමේන්තුවට අනුයුක්තව සංඥා භාෂා නිලධාරීන් 06 දෙනෙකු සේවය කරන අතර ඉන් නිලධාරීන් තිදෙනෙකු වෘත්තීය පුහුණු ආයතන වල ද අනෙක් නිලධාරීන් තිදෙනා ප්‍රධාන කාර්යාලයේ සංඥා භාෂා අංශයේ ද සේවය කරනු ලබයි.

ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන්ගේ සන්නිවේදනය වෙනුවෙන් රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය සහාය ලබා දීම (උදා . ලෙස පොලිස් ස්ථාන, අධිකරණ, රෝහල් හා රජයේ අනෙකුත් ආයතන) මෙන්ම ජාතික රූපවාහිනී නාලිකාවේ රාත්‍රී 8.00, ස්වාධීන රූපවාහිනී නාලිකාවේ සවස 6.30 හා සිරස රූපවාහිනී නාලිකාවේ රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති විකාශන සඳහා ද සංඥා භාෂා පරිවර්තකයින්ගේ සේවය සපයනු ලැබේ .

1.5.1.3 ප්‍රජා මූලික පුනරුත්ථාපන (සී.බී.ආර්) අංශය

ආබාධ සහිත පුද්ගලයින් ප්‍රජාවේ පුනරුත්ථාපනය කිරීම හෙවත් ප්‍රජා මූලික පුනරුත්ථාපන (සී.බී.ආර්) වැඩසටහන වනාහී ආබාධ සහිත පුද්ගලයින් සඳහා සේවා සැපයීම, සමාන අවස්ථා සම්පාදනය කිරීම සහ ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කරමින් නගා සිටුවීමෙහිලා වන උපාය මාර්ගයක් වෙයි .

ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ජාතික වැඩසටහනක් ලෙස සමාජ සේවා විෂය භාර අමාත්‍යාංශය යටතේ 1994 වර්ෂයේ සී.බී.ආර් වැඩසටහන ආරම්භ කරන ලද අතර මේ වන විට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සී.බී.ආර් අංශය මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

ආබාධිතතාවන් ඇති පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල් අතරත්, ඔවුන් හා ඔවුන් ජීවත් වන ප්‍රජාවේ සමාජ සංවිධාන අතරත්, සබඳතා තර කිරීම මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, බලගැන්වීම හා ස්වාධීනව කටයුතු කිරීමට හැකිවන පරිදි ඔවුන් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහනෙහි නිරත වී සිටින ක්ෂේත්‍රගත නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම, ඊට අදාළ වැඩසටහන්, ව්‍යාපෘති සංවිධානය කිරීම හා මෙහෙයවීම හරහා පහත සඳහන් කාර්යයන් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

- ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන පුනරුත්ථාපන සැළසුම් සකස් කිරීම මගින් පුනරුත්ථාපනය සිදු කිරීම.

- ආබාධ සහිත වූවන් සඳහා සෘජු ප්‍රතිපාදන ලබා දීම හා පසුභාර කටයුතු සිදු කිරීම. (කොමඩ්, ජලය, විදුලි බල පහසුකම් හා ප්‍රවේශ පහසුකම් ලබා දීම.)
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා සවිබලගැන්වීම සහ ''ස්වාභිමානී'' නමින් වාර්ෂික උළෙලක් හරහා ස්වශක්ති සංවිධාන හා පුද්ගලයින් ඇගයීමට ලක් කිරීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන වෙනත් සංවිධාන සමග ඒකාබද්ධ වී සේවා අවශ්‍යතා ලබා ගැනීමට පහසුකම් ඇති කිරීම.
- ආබාධිත ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීම.
- දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- සී.බී.ආර් වැඩසටහනට සම්බන්ධ වෙමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සිදුකරන සමාජ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.5.1.4 සේවා අංශය

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින ආබාධ සහිත තත්ත්වයට පත් පුද්ගලයන් රාජ්‍ය අනුග්‍රහය යටතේ සවිබල ගන්වා අභිමානවත් පුරවැසියන් ලෙස ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කරලීම අරමුණු කර ගනිමින් සේවා අංශය ක්‍රියාත්මක වන අතර, එකී අරමුණ සාධනයෙහිලා පහත සඳහන් කාර්යභාරයන් ඉටුකරනු ලබයි.

- වයස අවුරුදු 16-35 අතර ආබාධ සහිත ප්‍රජාව ව්‍යාත්තීය පුහුණුව තුළින් බලගන්වා රැකියාගත කිරීම
- ආබාධ සහිත දරුවන් පෙර පාසල් අධ්‍යාපනය හා පාසල් අධ්‍යාපනය දක්වා සංවර්ධනය කිරීමට අදාළව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හරහා සේවා සැපයීම
- මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා මත්ලෝලී පුනරුත්ථාපන මධ්‍යස්ථානය මගින් මත්ලෝලීන් පුනරුත්ථාපනය හා සමාජගත කිරීමට අදාළ සේවා සැපයීම
- ආබාධ සහිත දරුවන් සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන පෙර පාසල්වල ගුරුවරුන්ගේ සේවා ඇගයීම හා අභිප්‍රේරණය සඳහා දීමනා ලබා දීම
- දෙමව්පියන් අභිමි බුද්ධි ඌනතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථානය හරහා බුද්ධි ඌනතා සහිත පුද්ගලයන්ගේ රැකවරණය සඳහා අවශ්‍ය සේවා සැපයීම.
- ආබාධ සහිත ප්‍රජාව සඳහා ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධාන සඳහා නඩත්තු ආධාර ලබාදෙමින් එම ආයතන සිදු කරනු ලබන සමාජ මෙහෙවරට රාජ්‍ය අනුග්‍රහය දැක්වීම.
- ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා හැඳුනුම්පත් ලබා දීම.

1.5.1.5 සංවර්ධන අංශය

සංවර්ධන අංශය මඟින් දෙපාර්තමේන්තුවේ සමස්ත ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපානු ලබන කාර්යභාරයන් රාශියක් සිදුකරනු ලබයි. විශේෂයෙන්ම නිලධාරින්ගේ ධාරිතාවන් සංවර්ධනය කිරීමට සමගාමීව සිදුවන පුහුණු, දැනුම් යාවත්කාලීන කිරීම, ඵලදායිතාවයන් සංවර්ධනය කිරීම ආදිය මුල් තැනක් ගනු ලබයි.

එසේම ජාතික වැඩසටහන් සංවිධානය, සම්බන්ධීකරණය හා මෙහෙයවීම, විවිධ ව්‍යාපෘතීන්, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, තොරතුරු යාවත්කාලීන කිරීම හා නූතන සමාජ ප්‍රවණතාවයන් හඳුනාගැනීම මෙන්ම ඒවා භාවිතයට ගැනීම පිළිබඳව ද වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එයට අමතරව දෙපාර්තමේන්තුවේ අරමුණු වලට අනුගතව යමින් දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා වන පහත කාර්යයන් ද සිදු කරනු ලබයි.

- දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පවත්වනු ලබන ජාතික වැඩසටහන් (ආබාධ සහිත වූවන්ගේ ජාතික ආධුනික මලල ක්‍රීඩා උළෙල, සින් රූ ජාතික කලා ප්‍රසංගය, බක්මහ උළෙල) සංවිධානය, සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
- දෙපාර්තමේන්තු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්ය සාධන වාර්තාව හා ප්‍රගති වාර්තා සැකසීම.
- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම.
- රෝහල්වල රෝගී සුභසාධන කටයුතු වලට අදාළ නිලධාරින් සම්බන්ධ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ස්වේච්ඡා සංවිධාන සම්බන්ධ රාජකාරි හා සමාජ සේවා සංවිධානවලට (දේශීය ආදායම් පනත යටතේ ලියාපදිංචි පුනර්ජනන හෝ ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි ලාභ නොලබන සංවිධාන) ලැබෙන විදේශීය පරිත්‍යාග සඳහා තීරුබදු සහන ලබාදීමට අවශ්‍ය නිර්දේශ ලබාදීමට අදාළ රාජකාරී කටයුතු.
- දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පවරා ගැනීම හා ඒ සම්බන්ධයෙන් පවතින ගැටළු නිරවුල් කිරීම හා ඊට අදාළව උපලේඛන පවත්වාගෙන යාම.
- ආබාධිතතාවයන්ට අදාළව විවිධ සහන සැලසීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්, දර්ශක, න්‍යායන් හා නවීන මතවාද හඳුනා ගැනීම.
- ස්වේච්ඡා කටයුතු පිළිබඳ ජාතික මහලේකම් කාර්යාලයටඅදාළ රාජකාරී කටයුතු.
- ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.5.1.6 මූල්‍ය හා ගිණුම් අංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුවට අදාළව මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, දෙපාර්තමේන්තු ගිණුම් පවත්වා ගනිමින් විනිවිද භාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම මූල්‍ය හා ගිණුම් අංශය මඟින් ඉටු කරන ප්‍රධාන කාර්යභාරය වේ.

මෙහි ප්‍රධාන ගණකාධිකාරවරයා ගේ මඟපෙන්වීම, කළමනාකරණය, අධීක්ෂණය හා මෙහෙය වීම මගින් මූල්‍ය හා ගිණුම් කටයුතු සිදුවන අතර මුදල් රෙගුලාසි, විශේෂ විධි විධාන හා රජයේ චක්‍රලේඛ මගින් ලබාදී ඇති බලතල අනුව පහත සඳහන් කාර්යයන් ද සිදු කරනු ලබයි.

- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර නියමිත දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
- සියලුම ගණුදෙනු නිවැරදි හා යාවත්කාලීන ගිණුම් තැබීම හා ගිණුම් ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමට ඉහළ කළමනාකරණය වෙත සහාය වීම.
- සියලුම ලැබීම් හා වියදම් අධීක්ෂණය සහ වියදම් පාලනය.
- වියදම් සමාලෝචනය සඳහා ඉහළ කළමනාකරණය වෙත යෝජනා ඉදිරිපත් කිරීම.
- මහා භාණ්ඩාගාර සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- සියළුම මිලදී ගැනීම් වලදී විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම හා සහය වීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ වත්කම් යාවත්කාලීන කිරීම හා කළමනාකරණය.

1.5.1.7 අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 වගන්ති වල සඳහන් රාජකාරී හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයෙ හි උපදෙස් මෙන්ම 2018 අංක 19 දරන විගණන පනතේ VII කොටසෙහි 40 වගන්තියේ විධිවිධාන අනුව සමාජ සේවා අධ්‍යක්ෂ වෙත සෘජුව වාර්තා කිරීම සඳහා බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු සහිතව මෙම අංශය ක්‍රියාත්මක වේ.

එමෙන්ම ආයතනයේ අරමුණු කරා ළඟා වීමේදී මූල්‍ය සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, පොත්පත් හා ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාම, මූල්‍ය කළමනාකරණය හා අධීක්ෂණය හා කළමනාකරණ තොරතුරු සැපයීමේ ක්‍රමවේදය සඵලදායි ලෙස සිදුවන බවට සහතිකවීම මෙම අංශයේ අරමුණ වේ.

1.5.1.8 පර්යේෂණ හා මාධ්‍ය අංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ''පර්යේෂණ පුහුණු හා සංවර්ධන'' නමින් ක්‍රියාත්මක වූ අංශයේ පර්යේෂණ කොටස 2021 වර්ෂයේ සිට වෙනම අංශයක් ලෙස පර්යේෂණ හා මාධ්‍ය අංශය නමින් ස්ථාපිත කෙරිණි. සේවාලාභීන්ගේ ගැටළු සහ අවශ්‍යතා හඳුනාගනිමින් ඔවුන් වෙත වඩාත් සඵලදායී සේවාවක් ලබාදීම මෙම අංශය ස්ථාපිත කිරීමේ මුඛ්‍ය අරමුණ වන අතර, එකී අරමුණ සාක්ෂාත් කරගැනීමෙහි ලා පහත සඳහන් කාර්යභාරයන් ඉටුකරනු ලබයි.

- සමාජ ආර්ථික වටපිටාව තුළ සිදු වන සමාජ පරිවර්තනයන් සමග නිර්මාණය වන්නාවූ සමාජ ගැටළු හා ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ සිදු කිරීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන්වල ගුණාත්මකභාවය හා ඵලදායීතාවය මැන බැලීම සඳහා පර්යේෂණය කිරීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුවට අදාළ අණපනත් පිළිබඳ අවධානය යොමු කර නූතන අවශ්‍යතාවයනට අනුකූල වන පරිදි සංශෝධනයට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් හා ජාතික උත්සවවලට අදාළ මාධ්‍ය නිවේදන සකස් කිරීම හා මාධ්‍ය ආවරණයට අදාළ සම්බන්ධීකරණ කටයුතු.
- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ප්‍රවර්ධනය කිරීම, ඉලක්කගත සේවාලාභීන් දැනුවත් කිරීම හා ආකර්ශනය කර ගැනීම සඳහා ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා ලිඛිත මාධ්‍ය ප්‍රවර්ධන මෙවලම් නිර්මාණය කිරීම.

1.5.2 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

1.5.2.1 වෘත්තීය පුහුණු ආයතන

ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කොට ගනිමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන 09ක් හා අනුබද්ධිත වෘත්තීය පුහුණු ආයතන 01ක් ගම්පහ, මහනුවර, රත්නපුර, හම්බන්තොට, පුත්තලම, කෑගල්ල හා මඩකලපුව යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. මෙම වෘත්තීය පුහුණු ආයතන හරහා දිවයින පුරාම විසිරී සිටින ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම හා කුසලතා සංවර්ධනය තුළින් ඔවුන් සංවර්ධනයට දායක කර ගැනීම සිදු කෙරේ.

වෘත්තීය පුහුණු ආයතන පිළිබඳ මූලික තොරතුරු

වෘත්තීය පුහුණු ආයතනයේ නම	ආයතනය පිහිටි පළාත	ආයතනය පිහිටි දිස්ත්‍රික්කය	ආරම්භ කරල ලද වර්ෂය/දිනය	ලිපිනය	දුරකථන අංකය
සීදුව	බස්නාහිර	ගම්පහ	1956 ඔක්තෝබර් 01	ලියනගේමුල්ල, සීදුව	011-2253503
වත්තේගම	මධ්‍යම	මහනුවර	1963 පෙබරවාරි 15	වාවින්න,වත්තේගම	081-2476209
කැටවල			1968	කැටවල, ලෙව්ල, මහනුවර	081-2219153
තෙළඹුයාය	දකුණ	හම්බන්තොට	1981 මාර්තු 28	තෙළඹුයාය,අඟුණ කොළපැලැස්ස	047-3489296
රාගම	බස්නාහිර	ගම්පහ	1984 ජනවාරි 18	පුනරුත්ථාපන රෝහල, රාගම	011-2967342
අමුණුකුඹුර			1990 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, 1991 වර්ෂයේ වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස වැඩිදියුණු කර ඇත.	අමුණුකුඹුර, වතුරුගම	033-2279321
කලවාන	සබරගමුව	රත්නපුරය	2006 මාර්තු 24	පහළ කුකුලේගම, මීපාගම, කලවාන	045-2255017
මාදම්පේ	වයඹ	පුත්තලම	2014 ජූනි 15	දේවාල පාර, පොතුවිල, මාදම්පේ	032-2248568
තෝලංගමුව අනුබද්ධ වෘත්තීය පුහුණු ආයතනය	සබරගමුව	කෑගල්ල	2021නොවැම්බර් 17	අනුබද්ධ වෘත්තීය පුහුණු ආයතනය, තෝලංගමුව	
මඩකලපුව	නැගෙනහිර	මඩකලපුව	2021 දෙසැම්බර් 02	කුඹුරුමූලෛ, වාලච්චේනෛ	065-3132223

ක්‍රියාකාරකම්

I. ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා පෞරුෂ වර්ධනය කිරීම.

II. ආබාධ සහිත තරුණ තරුණියන්ගේ ක්‍රීඩා හා කලා කුසලතා සංවර්ධනය කිරීම.

III. විධිමත් පරිදි පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා සහතික පත් ලබා දීම හා සමාජ ගත කිරීම.

IV. ස්වයංරැකියා සඳහා මෙවලම් කට්ටල ලබා දීම හා විවෘත වෙළඳපොළ අංශයේ රැකියා අවස්ථා හඳුන්වාදීම.

වයස අවු 16 – 35 ත් අතර සුදුසුකම් ඇති ආබාධ සහිත තරුණ තරුණියන් විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ සිදුකරනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසු ඔවුන්ගේ හැකියාවන්ට ගැලපෙන පුහුණු පාඨමාලාවන් සඳහා තෝරා ගැනේ. පාඨමාලාවේ ස්වභාවය අනුව පුහුණු කාලය වෙනස් වන අතර ඒ අනුව වසරක හෝ වසර දෙකක විධිමත් පුහුණුවක් තෝරාගත් අභ්‍යාසලාභීන් සඳහා ලබාදේ. විවිධ වූ පාඨමාලා 26ක් යටතේ මෙම පුහුණුව ලබාදෙන අතර පුහුණු කාලය තුළ දෛනික දිමනාවක් හා නේවාසික පහසුකම්, ආහාරපාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයේ.

වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා

පාඨමාලාව	ධාරිතාවය	130	50	100	100	100	24	30	40	50	20
	බඳවා ගන්නා අභ්‍යාසලාභීන්	ගැහැණු	සිසිල්	ගැහැණු	ගැහැණු	ගැහැණු	ගැහැණු	සිසිල්	ගැහැණු	ගැහැණු	ගැහැණු
	පාඨමාලා කාලය	සිසිල	ඝාටලල	ධන්ත්ගම	නෙළඹුගාය	එම්ණුඹුර	රාගම *	කලවාන	මැදමුළු	මධ්‍යමස්ථාන	නෙල්ලංගල
1. ගුවන්විදුලි යන්ත්‍ර,රූපවාහිනී යන්ත්‍ර සහ ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පය	අවු.02	■		■	■		■			■	
2. වඩු කාර්මික ශිල්පය	අවු.02	■	■		■	■					
3. ඇඳුම් මැසීමේ ශිල්පය	අවු.02	■		■	■		■		■	■	
4. පරිගණක	අවු.02	■	■	■	■		■		■		
5. ත්‍රි රෝද රථ හා මෝටර් සයිකල් කාර්මික ශිල්පය	අවු.02			■							
6. මෝටර් රථ කාර්මික ශිල්පය	අවු.02			■	■						
7. ගෙවතු වගා කෘෂිකර්මික ශිල්පය	අවු.02				■	■		■			
8. ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පිය	අවු.01	■									
9. මහන යන්ත්‍ර ක්‍රියාකරවීම (කර්මාන්තශාලා - ජූකී)	අවු.01	■							■		
10. හස්ත කර්මාන්ත ශිල්පය (උණ/පොල්)	අවු.02							■			
11. හස්ත කර්මාන්ත ශිල්පය (කොසු හා ඉදල්)	අවු.01					■					
12. හස්ත කර්මාන්ත ශිල්පය (වේවැල් හා කොහු)	අවු.01	■									
13. හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු)	අවු.01					■			■		■
14. ටෙලරින් ශිල්පය	අවු.01			■		■					
15. සම්බාහන චිකිත්සාව	අවු.01	■									
16. පෙදරේරු කාර්මික ශිල්පය	අවු.02			■							
17. විදුලි ශිල්පය	අවු.02		■		■						
18. මෝටර් රථ පින්තාරු ශිල්පය	අවු.02		■								
19. පෑස්සුම් ශිල්පය	අවු.02		■								
20. සිමෙන්ති නිෂ්පාදන ශිල්පය	අවු.02					■					
21. පාවහන් හා සම් කර්මාන්ත ශිල්පය	අවු.01			■							
22. බතික් නිර්මාණ ශිල්පය	අවු.01			■							■
23. බේකරි ශිල්පය/ ආහාර තාක්ෂණය	අවු.01					■					
24. පේෂ කර්ම ශිල්පය	අවු.01	■									
25. රූපලාවන්‍ය	අවු.01			■							
26. ලී කැටයම්	අවු.02	■									

* රාගම වෘත්තීය පුහුණු ආයතනයේ පාඨමාලා කාලය මාස 06 සිට අවුරුදු 01 දක්වා වෙනස් විය හැකිය.

1.5.2.2 ජයවිරු සෙවණ රැකවරණ නිවහන

දෙමාපිය රැකවරණය අහිමි මන්ද මානසික ආබාධ සහිත පිරිමි දරුවන් සඳහා රැකවරණය සැපයීම වෙනුවෙන් 2001 ජූලි මස 31 වන දින ආරම්භ කරන ලද ජයවිරු සෙවණ ආයතනය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුවක්පිටිය උතුරු අම්බලන්වත්ත ප්‍රදේශයේ පිහිටා ඇත.

බුද්ධිමය ඌණතාවක් සහිත ප්‍රජාවට සෙනෙහස හා ආදරය ලබා දීම තුළින් හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වර්ධනයට අවස්ථාවක් සලසා දීමෙන් හා ඔවුන් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරවීමෙන් ජාතික සංවර්ධනයේ කොටස් කරුවන් කරවීම මෙහෙවර කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ආයතනය හරහා මුළු ජීවිත කාලයම නේවාසිකව සිටින මෙම ළමුන් හුදකලා නොකොට ආදරයෙන් සෙනෙහසින් රැකබලා ගන්නා අතරම දෛනික ක්‍රියාකාරකම් සඳහා යොමු කෙරේ. රැකවණය ලබන කාලසීමාව තුළ නේවාසික පහසුකම් ඇතුළුව ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ ලබාදීම ද සිදුකෙරේ.

1.5.2.3 ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම , සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වූ නවෝදය ව්‍යාපෘතියේ , අනුව්‍යාපෘතියක් ලෙස 2007.07.31 දින ආරම්භ කර ඇති මෙම ආයතනය බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුවක්පිටිය උතුරු අම්බලන්වත්ත ප්‍රදේශයේ පිහිටා ඇත.

පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙස වසර ගණනාවක් ක්‍රියාත්මක වූ ජයවිරු සමාධි නිවහන පවත්වාගෙන යාමේ දී දැක් වූ ගුණාත්මක සේවය අගය කිරීමක් ලෙස, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි කටයුතු නියාමනය සඳහා වන 2007 අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනතේ 2වන වගන්තිය යටතේ නාමෝද්දිෂ්ඨ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙසට නම් කිරීමට අන්තරාකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිර්දේශ ලබා දී ඇත.

සැබෑ ජීවන දර්ශනය හා ජීවිතයේ සැබෑ සතුට කියා දීමත්, හැකියාවන් ඔප් නැංවීමත් තුළින් මතට ඇති නැමියාව අවම කර, මතට බිලිවූ තරුණ පරපුර ජාතික සංවර්ධනයට දායක කර ගැනීමත් මෙහෙවර කර ගනිමින් විවිධ මත්ද්‍රව්‍ය වලට අබ්බැහි වූ මත්ලෝලීන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම මෙම ආයතනය මගින් සිදු කෙරේ.

අධිකරණ නියෝග මගින්, ස්වේච්ඡාවෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෝහල් මගින් යොමු කරනු ලබන සේවාලාභීන් වරකට 60කට ආසන්න ප්‍රමාණයක් පුනරුත්ථාපනයට යොමුකළ හැකි අතර, පුනරුත්ථාපන කාලය මාස 03, මාස 06 හා වසර 01 දක්වා වූ කාලයන් අනුව සිදු වේ. අධිකරණ නියෝග මත යොමු කෙරෙන සේවාලාභීන්ගේ පුනරුත්ථාපන කාලය තීරණය කෙරෙනුයේ අධිකරණ නියෝගය ප්‍රකාරවය.

ක්‍රියාකාරකම්

I. මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් වැඩි දියුණු කිරීම හා සමාජ ගත කිරීම.
II. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම නිසා ඔවුන්ගේ පවුල් පරිසරය තුළ හටගෙන ඇති ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම.
III. මත්ද්‍රව්‍ය භාවිතය නිසා බිඳවැටුණු රැකියාවන් හා අධ්‍යාපන කටයුතු යථා තත්ත්වයට ගෙන ඒම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධතා ගොඩනැගීම.
IV. අවදානම් කණ්ඩායම් සඳහා මත් ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

1.5.2.4 නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය

ළමයෙකුගේ උපතේ දී සිටම වර්ධනයේ කිසියම් අස්වාභාවික තත්ත්වයක් හෝ ප්‍රමාදයක් හෝ ඇති බවට සැක සහිත අවස්ථාවක ඒ සඳහා කල් ඇතිව මැදිහත් වී දරුවා සංවර්ධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම අරමුණු කර ගනිමින් 2003 වර්ෂයේ දී බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නාවින්න, පතිරගොඩ ප්‍රදේශයේ මෙම ආයතනය ස්ථාපිත කර ඇත.

නිවැරදි මාර්ගෝපදේශයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් ආයතනයට පැමිණෙන දෙමාපියන් සඳහා මූලිකවම සිදුකෙරෙනුයේ දරුවාගේ ජීවන තොරතුරු ලබාගෙන දරුවා ලියාපදිංචි කර, දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන වර්ධන තත්ත්වයේ නිවැරදි තක්සේරුවක් සහතික කරවා ගැනීමයි.

දෙමාපියන් හා පවුලේ සාමාජිකයන් අභියෝග වලට අභිමානවත්ව මුහුණදීම සඳහා සවිබලගන්වමින්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ උපරිම සංවර්ධනය සඳහා කල් ඇතිව මැදිහත්වෙමින්, දිරිගන්වමින් නිසි වේලාවට ළඟා කරන්නාවූ සේවා ජාලයක් ගොඩනැංවීමේ හා සම්බන්ධීකරණය කිරීමේ මැදිහත්කරුවකු වශයෙන් කටයුතු කිරීම මෙහෙවර කර ගනිමින් කටයුතු කරන මෙම ආයතනය හරහා ආබාධ සහිත දරුවන් 80 කට ආසන්න ප්‍රමාණයක් සඳහා සේවාවන් සපයනු ලැබේ.

ක්‍රියාකාරකම්

I. ළමා ආබාධ කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා මැදිහත්වීමේ වඩාත් ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දීම.
II. ආබාධ සහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලට අදාළ සේවා ජාලය ශක්තිමත් කිරීම.
III. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.
IV. දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්ත්වය වඩාත් යහපත් තත්ත්වයට ගෙන ඒම සඳහා උපදේශන සේවා පවත්වාගෙන යාම.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1.6.1 දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ නව ආකල්ප වර්ධනය ක්‍රමයෙන් ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟය. ඊට සමගාමීව ආබාධ සහිත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ඔවුන් සවිබලගැන්වීම සඳහා රාජ්‍ය අනුග්‍රහය සහිතව ජාතික මට්ටමේ ප්‍රතිපත්තිමය තීරණ ගනු ලැබීය. ඒ යටතේ දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම මෙහෙවර කර ගනිමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට ඇත.

මෙම පනතට අනුව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් විවිධ සේවාවන් ක්‍රියාත්මක කරමින් සමාජ සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් හරහා පාලනය වන මෙම අරමුදල සමාජ සේවා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබයි.

ක්‍රියාකාරකම්

I. දෘශ්‍යාබාධිත පුද්ගලයින් සහ දෘශ්‍යාබාධිත සංවිධාන සඳහා ක්‍රීඩා ආධාර ලබාදීම.

II. වෘත්තීය පුහුණු කටයුතු.
- දෘශ්‍යාබාධිත උපදේශකවරුන් මගින් දෘශ්‍යාබාධිත අභ්‍යාසලාභීන් පුහුණු කිරීම

III. අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබාදීම.
- දෘශ්‍යාබාධිත සිසුන් සහ දෘශ්‍යාබාධිත දෙමව්පියන්ගේ දෘශ්‍යාබාධිත නොවන පාසල් දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම
- දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම
- හා දෘශ්‍යාබාධිත පාඨකයන් සඳහා බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරන ‘‘කාලය’’ සඟරාව සඳහා ආධාර ලබාදීම

IV. පුනරුත්ථාපන ආධාර ලබාදීම ලබාදීම.
- පසුකාලීනව දෘශ්‍යාබාධිත තත්ත්වයට පත් තැනැත්තන් මානසික වශයෙන් බලගැන්වීම හා සමාජගත කිරීමේ වැඩසටහන.
- කථන පුස්තක වැඩසටහන - දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ කියවීමේ අයිතිය තහවුරු කිරීම සඳහා සාමාන්‍ය අකුරින් මුද්‍රිත ග්‍රන්ථ කථන ග්‍රන්ථ බවට පරිවර්තනය කිරීම.
- කොවිඩ් වසංගතය හේතුවෙන්, පවත්වාගෙන යන ලද ස්වයංරැකියාව අතහැර දැමූ හෝ ස්වයංරැකියාව පවත්වාගෙන යාමට අපහසුතා ඇති වූ පුද්ගලයින් සඳහා ස්වයංරැකියා ආධාර ලබා දීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිය හා පානීය ජලය ලබාගැනීම සඳහා ආධාර ලබාදීම.

- අවස්ථානුකූලව දෘශ්‍යාබාධිත පුද්ගලයින් හෝ අදෘශ්‍යාබාධ සහිත පුද්ගල සංවිධාන විසින් කරනු ලබන ඉල්ලීම්වලට අනුව ආධාර ලබාදීම.

V. අක්ෂි කාච සහ අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබාදීම.

VI. ජාත්‍යන්තර සුදු සැරයටි සැමරුම් දින ජාතික වැඩසටහන පැවැත්වීම.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

අ) ව්‍යාපෘතියේ නම :- Project for Promoting Employment Support of Persons with Disabilities in Sri Lanka (ESPD)

ආ) දායක නියෝජිත ආයතනය:- ජපන් ජාත්‍යන්තර සහයෝගීතා පදනම (JICA)

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම:- රු.මි 360 (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා පදනම (JICA) රු.මි 350, ශ්‍රී ලංකා රජය - සමාජ සේවා දෙපාර්තමේන්තුව රු.මි 10)

ඈ) ව්‍යාපෘති කාලය:- අවු 4 (2021 නොවැම්බර් - 2025 නොවැම්බර්)

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය

2.1. ආබාධ සහිත වූවන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහන

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රධානතම වැඩසටහන වන්නේ ආබාධ සහිත සහිත තැනැත්තන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහනයි. දෙපාර්තමේන්තු මෙහෙවරට අනුගත වෙමින් මෙම වැඩසටහන මගින් අපේක්ෂිත අරමුණු සාධනයෙහිලා ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන්, ව්‍යාපෘති හා උප ව්‍යාපෘති කිහිපයක් පවතින අතර, ඒවා පහත පරිදි වේ.

- ආබාධ සහිත තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව ලබා දීම තුළින් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම
- මුල් ළමාවියේදීම ඇතිවන ආබාධ සහිත තත්ත්වයන් හඳුනාගෙන අවශ්‍ය මැදිහත් වීම හා සංවර්ධනය කිරීම
- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ස්වේච්ඡා සංවිධාන සඳහා දීමනා ලබාදීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන
- දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල හරහා දෘශ්‍යාබාධ සහිත ප්‍රාජාව පුනරුත්ථාපනය කිරීම
- ආබාධ සහිත දරු දැරියන්ගේ ක්‍රීඩා හා කලා කුසලතා සංවර්ධන වැඩසටහන

2.1.1 ආබාධ සහිත තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව ලබා දීම තුළින් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛතම ව්‍යාපෘතිය වන්නේ ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමයි. දිවයින පුරා ව්‍යාප්තව පවතින වෘත්තිය පුහුණු ආයතන 09ක් හරහා වාර්ෂිකව ආබාධ සහිත තරුණ තරුණියන් 500කට අධික ප්‍රමාණයකට වෘත්තීය පුහුණුව ලබා දීම සිදු කරයි.

කොවිඩ් 19 වසංගත ව්‍යාප්තවීම වැලැක්වීම සඳහා පනවන ලද සීමාකම් හේතුවෙන් 2020 හා 2021 වසර දෙකෙහිම සැලකිය යුතු කාලයක් වෘත්තීය පුහුණු ආයතන වසා තැබීමට සිදු විය.

එහෙයින් 2020 අධ්‍යයන වර්ෂයට අදාළ එක් අවුරුදු පාඨමාලා 2021 අප්‍රේල් මාසය දක්වා ක්‍රියාත්මක වූ අතර, දෙවන වසර අධ්‍යයන කටයුතු මාර්ග ගත ක්‍රමය ඔස්සේ අඛණ්ඩව පැවතිණි. 2021 අධ්‍යයන වර්ෂය සඳහා නව අභ්‍යාසලාභීන් බඳවා ගැනීම 2021 අප්‍රේල් මස සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද සෞඛ්‍ය සේවා

අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශයන් හේතුවෙන් එකී බඳවා ගැනීම් 2021 නොවැම්බර් මාසය දක්වා කල් දැමීමට සිදුවිය.

වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් සංඛ්‍යාව



පෙර වසරවලට සාපේක්ෂව 2020 හා 2021 යන වර්ෂ දෙක තුළම අභ්‍යාසලාභීන්ගේ අඩුවීමක් දක්නට ලැබුණු අතර, 2020 වර්ෂයට සාපේක්ෂව එය 41%ක අඩුවීමකි. ආයතන මට්ටමින් ගත් කළ 2021 වසර තුළ ආරම්භ කරන ලද මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය හැර සෑම ආයතනයකම වෘත්තීය පුහුණුව ලැබූ අභ්‍යාසලාභීන්ගේ අඩුවීමක් දක්නට ලැබෙන අතර, කොවිඩ් 19 වසංගතය ව්‍යාප්තිය තුළින් ඇති කරනු ලැබූ බලපෑම මේ සඳහා හේතු වී ඇත.

2.1.2 ළමා මාර්ගෝපදේශන වැඩසටහන

ළමා මාර්ගෝපදේශන ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය වෙතින් වාර්ෂිකව 100කට ආසන්න ප්‍රමාණයක් සේවා ලබාගනී. 2021 වර්ෂයේ ආයතන මගින් සේවා සපයන ලද මුළු සේවා ලාභීන් සංඛ්‍යාව 93ක් පමණ වූ අතර, ඉන් නවක සේවා ලාභීන් ලෙස ලියාපදිංචි වූ සංඛ්‍යාව 20කි. මෙසේ යොමු වූ සේවාලාභීන්ගෙන් 07 දෙනෙකු පමණ සාමාන්‍ය පාසල්වලට යොමු කිරීම ද සිදුකර ඇත.

2021 වර්ෂයේ ලියාපදිංචි නවක සේවාලාභීන් ගණන - 20 (පිරිමි ළමුන් 17 /ගැහැණු ළමුන් 03)

වසය පරාසය (අවු.)	ආබාධයේ ස්වභාවය									මුළු ළමුන් එකතුව
	ඔටිසම්	මස්තිෂ්ක ආඝාතය	ඩවුන් සින්ඩ්‍රෝම්	වර්ධනය ප්‍රමාද	කථනාබාධ	අධි ක්‍රියාකාරී	ශ්‍රවණාබාධ	මන්ද මානසික	වෙනත්	
0 – 03	2	-	1	-	-	-	-	-	-	**3**
03 – 05	3	-	2	3	1	-	-	-	-	**9**
05 - 15	1	1	2	-	4	-	-	-	-	**8**
15 - 18	-		-	-	-	-	-	-	-	**-**
18 ට වැඩි	-	-	-	-	-	-	-	-	-	-
එකතුව	**6**	**1**	**5**	**3**	**5**	**-**	**-**	**-**	**-**	**20**

2021 වර්ෂයේ මුළු සේවාලාභීන් සංඛ්‍යාව - 93 (පිරිමි 64 /ගැහැණු 29)

වසය පරාසය (අවු.)	ආබාධයේ ස්වභාවය									මුළු ළමුන් සංඛ්‍යාව
	ඔටිසම්	මස්තිෂ්ක ආඝාතය	ඩවුන් සින්ඩ්‍රෝම්	වර්ධනය ප්‍රමාද	කථනාබාධ	අධි ක්‍රියාකාරී	ශ්‍රවණාබාධ	මන්ද මානසික	වෙනත්	
0 - 03	2	-	4	4	1	-	-	-	-	**11**
03 - 05	7	1	4	5	1	-	-	-	-	**18**
05 - 15	11	10	8	14	3	-	2	1	-	**49**
15 - 18	-	1	9	1	-	-	-	-	-	**11**
18 ට වැඩි	1	-	2	-	-	-	-	1	-	**4**
එකතුව	**21**	**12**	**27**	**24**	**5**	**-**	**2**	**2**	**-**	**93**

එක් එක් අංශ මගින් ලබාදුන් සේවා පිළිබඳ විස්තර

ලබා දුන් සේවය	ළමුන් සංඛ්‍යාව	සේවා වාර ගණන
භෞත චිකිත්සක සේවා	18	18
කථන චිකිත්සක සේවා	34	34
අධ්‍යාපන හා පූර්ව වෘත්තීය පුහුණු	65	1860

මාර්ග ගත ක්‍රමය (Online) ලබාදුන් සේවාවන් පිළිබඳ විස්තර

ලබා දුන් සේවය	ළමුන් සංඛ්‍යාව	සේවා වාර ගණන
අධ්‍යාපන අංශය	65	3036
කථන චිකිත්සක	40	55
දෛනික ක්‍රියාකාරකම්	57	214

2.1.3 ස්වේච්ඡා සංවිධාන සඳහා දීමනා ලබා දීමේ වැඩසටහන

ආබාධ සහිත තැනැත්තන් සඳහා සේවා සැපයීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධානවලින් (ග්‍රාමීය පුහුණු ආයතන, කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන, විශේෂ ඒකක) තෝරාගත් සංවිධාන කිහිපයක් සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් දීමනා ලබා දීම සිදු කෙරේ. මෙලෙස ලබාදෙන දීමනා ආයතනයේ ස්වභාවය, අවශ්‍යතාවය හා ඉල්ලීම මත අභ්‍යාසලාභී දීමනා, නඩත්තු දීමනා, සහභාගීත්ව දීමනා, ගුරු දීමනා, සංග්‍රහ දීමනා, ප්‍රවාහන දීමනා ලෙස විවිධ ස්වරූපයක් ගනී. 2021 වර්ෂය තුළ ඉහත දීමනා එකක් හෝ කිහිපයක් ලබා දුන් ස්වේච්ඡා සංවිධාන සංඛ්‍යාව 23ක් වූ අතර, ඒ එක් එක් ආයතනය සඳහා දෙනු ලැබූ දීමනාවන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ස්වේච්ඡා සංවිධාන සඳහා ලබාදුන් දීමනා සංඛ්‍යාව

අනු අංකය	ස්වේච්ඡා සංවිධානය	අභ්‍යාසලාභී දීමනා (රු 75/-)	නඩත්තු දීමනා (රු 75/-)	සහභාගීත්ව දීමනා (රු 100/-)	ගුරු දීමනා (රු 10,000/-)	සංග්‍රහ දීමනා (රු 50/-)	ප්‍රවාහන දීමනා
01	කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය -මාලමුල්ල	-	-		02		-
02	ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - ගැට්ටුවාන	-	-	15	02	15	-
03	ලිට්ල් ෆ්ලවර් විශේෂ ළමා සංවර්ධන මධ්‍යස්ථානය - බඩල්කුඹුර	-	-	22	03	22	-
04	ලිට්ල් ෆ්ලවර් විශේෂ ළමා සංවර්ධන මධ්‍යස්ථානය - ඉබ්බාගමුව	-	-	22	01	22	-
05	ආබාධිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය,තෝලංගමුව	-	-	15	03	15	-
06	ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය, අක්මීමන	-	-	-	01	-	-
07	ආබාධිත පුද්ගල සංවර්ධන පදනම, බණ්ඩාරවෙල	26	26	-	-	-	-
08	රියන්සි අලගියවන්න ග්‍රාමීය පුහුණු ආයතනය - බටුගම්මන	16	16	-	-	-	-
09	මන්ද මානසික කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - රොටුව		29	-	-	-	-
10	ජාතික මානසික සෞඛ්‍ය සභාව - සහනය කොළඹ	-	-	-	-	15	15
11	රිටිගහයාය මහා විද්‍යාලය, කටුවන	-	-	-	01	-	-
12	කටුවන ප්‍රාථමික පාසල,කටුවන	-	-	-	01	-	-
13	අරුණැල්ල විශේෂ පාසල - වීරකැටිය	15	-	-	03	-	-
14	කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - රාජාංගනය	-	-	-	02	-	29
15	සෙනෙහස ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය, සූරියවැව	-	-	-	01	-	-
16	ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය, පොල්පිතිගම	-	-	15	02	15	-
17	"අපේ දරුවෝ" කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය,කුරුවිට	-	-	-	02	-	-
18	විශේෂ අධ්‍යාපන ඒකකය, දෙල්තොට	-	-	-	02	-	-
19	සහන සෙවණ, සේරුවිල	-	-	-	02	-	-
20	මානසික සෞඛ්‍ය ඒකකය, හපුතලේ	-	-	-	02	-	-
21	පැතුම් උයන මධ්‍යස්ථානය,මොරටුව	-	-	-	01	-	-
එකතුව		57	71	89	31	104	44

ඉහත දීමනාවන්ට අමතරව 2021 වර්ෂය තුළ නාත්තන්ඩිය ස්වර්ණදාම ආයතනය සඳහා රු 60,000/-ක් සහ රාජගිරිය ජාතික බිහිරි සේවා මණ්ඩලය සඳහා රු 40,000/- ක මුදලක් ලබා දී ඇති අතර, මාලමුල්ල කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය හා තෝලංගමුව ආබාධිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය යන ආයතන දෙක සඳහා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව, උද්‍යාන අලංකරණය හා ලිපිද්‍රව්‍ය සඳහා දීමනා ලබා දී ඇත.

2.1.4 දෙමාපියන් සහ භාරකරුවන් අභිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා රැකවරණය ලබා දීමේ වැඩසටහන

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන තවත් ප්‍රමුඛ වැඩසටහනක් වන්නේ දෙමාපියන් සහ භාරකරුවන් අහිමි විවිධ වයස් මට්ටම් ඇති බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා රැකවරණය ලබා දීමයි. මේ සඳහා ක්‍රියාත්මක කෙරෙන පුවක්පිටිය "ජයවිරු සෙවණ" ආයතනයේ 2021 වර්ෂයේ අළුතින් ඉදි කරන ලද නව දෙමහල් ගොඩනැගිල්ල හේතුවෙන් සේවාලාභීන් සඳහා පහසුකම් මෙන්ම ධාරිතාවය ද වැඩි කර ඇත.

2021 වර්ෂය අවසන් වන විට සේවාලාභීන් 76 දෙනෙකු සඳහා රැකවරණය ලබාදුන් අතර, මේ අයගෙන් 61ක් මන්ද මානසික ආබාධ සහිත පුද්ගලයන් විය. මානසික රෝගීන්, කථන හා ශ්‍රව්‍යාබාධ සහිත වූවන්, දෘශ්‍යාබාධ සහිත වූවන් සහ චලන ආබාධ සහිත වූවන් පිළිවෙලින් 05, 04, 03 හා 02ක් ලෙස විය. රැකවරණය ලැබූවන්ගෙන් එක් පුද්ගලයෙක් බහුවිධ ආබාධ සහිත විය.

වයස් මට්ටම අනුව රැකවරණය ලැබූ පිරිස



ආයතනයේ රැකවරණය ලබන පිරිසෙන් වැඩිම ප්‍රමාණයක් නියෝජනය කරනු ලබන්නේ වයස අවුරුදු 31-50 අතර මැදි වයසේ පසුවන පිරිසයි. එය සංඛ්‍යාත්මකව ගත් කළ 49කි. අවුරුදු 18-30 වයස් මට්ටමේ සිටින තරුණ පිරිස 15ක් පමණ වූ අතර, සේවා ලාභීන්ගෙන් අවම ප්‍රමාණය වයස අවුරුදු 51ට වැඩි පිරිස වන අතර එය සංඛ්‍යාත්මකව 12ක් පමණ වේ.

ආබාධ සහිත වූවන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහනේ භෞතික හා මුල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය 216 – 02- 03 – 1- 1501 (2021/12/31 දිනට)

අනු අංකය	ක්‍රියාකාරකම හා භෞතික ප්‍රගතිය	වියදම රු.
01.	පුහුණුව සඳහා අමුද්‍රව්‍ය හා වෙනත් I. අමු ද්‍රව්‍ය II. වෙනත් සුභසාධන වියදම් III. උපදේශන පුහුණු දීමනා IV. අධ්‍යාපන චාරිකා	10,256,013.23
02.	විධිමත් පරිදි වෘත්තීය පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් කට්ටල ලබා දීම. I. රු. 15,000/- ක් වටිනා මෙවලම් කට්ටල 148ක් ලබාදීම. II. අභ්‍යාසලාභීන් 42දෙනෙකු සඳහා මහන මැෂින් 42ක් ලබාදීම	5,539,293.00
03.	ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය I. සේවාලාභීන්ගේ පැමිණීමේ දීමනාව ලබා දීම. II. සංග්‍රහ වියදම් III. චිකිත්සකවරුන් සඳහා දීමනා	1,043,746.00
04.	දෙපාර්තමේන්තුව යටතේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා සංවිධානවල නඩත්තු හා යථායෝග්‍යාධාර ලබාදීම. I. බිහිරි සේවා මණ්ඩලය II. ස්වර්ණදාම පදනම	100,000.00
05.	බුද්ධි ඌණතා ළමුන් සඳහා වන පෙර පාසල් ගුරුවරුන් හට දීමනා ලබා දීම I. වීරකැටිය අරුණැල්ල විශේෂ පාසැල - ගුරුවරුන්- 03ක් II. හ/කටුවන රිටිගහයාය පෙර පාසල- ගුරුවරුන් - 02ක් III. බඩල්කුඹුර ලිට්ල් ෆ්ලවර්ස් ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - ගුරුවරු - 03ක් IV. තෝලංගමුව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය- ගුරුවරුන් - 03 V. ඉඹ්බාගමුව ලිට්ල් ෆ්ලවර් විශේෂ ළමා සංවර්ධන මධ්‍යස්ථානය ගුරුවරුන් - 01 VI. මාලමුල්ල කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය ගුරුවරුන් - 02 VII. ළමා කුසලතා මධ්‍යස්ථානය - අක්මීමන ගුරුවරුන් 01 VIII. ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ගැට්ටුවාන- ගුරුවරුන් 02	2,337,700.00

	IX. සහන සෙවණ සේරුවිල - ගුරුවරුන් 02 X. මානසික සෞඛ්‍ය ඒකකය හපුතලේ - ගුරුවරුන් 02 XI. විශේෂ අධ්‍යාපන ඒකකය, දෙල්තොට ගුරුවරුන් 02 XII. අපේ දරුවෝ කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය කුරුවිට- ගුරුවරුන් 02 XIII. පැතුම් උයන මධ්‍යස්ථානය, මොරටුව - ගුරුවරුන් 01 XIV. සෙනෙහස ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය, සූරියවැව - ගුරුවරුන් 01 XV. ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය, පොල්පිතිගම - ගුරුවරුන් 02 XVI. අනුබද්ධ වෘත්තීය පුහුණු ආයතනය තෝලංගමුව - ගුරුවරුන් 03 XVII. කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය, රාජාංගණය - ගුරුවරුන් 02	
06.	වෘත්තීය පුහුණු ආයතන නිල ඇඳුම් - ටී ෂර්ට්, බොටම්	2,394,427.50
07.	ස්වේච්ඡා ආයතනවල අභ්‍යාසලාභීන් සඳහා ප්‍රවාහන, තේ සහ කෙටි ආහාර හා සහභාගීත්ව දීමනා I. තෝලංගමුව ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය II. රාජාංගනය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය III. ඉබ්බාගමුව ලිට්ල් ෆ්ලවර් විශේෂ ළමා සංවර්ධන මධ්‍යස්ථානය IV. බඩල්කුඹුර ළමා සංවර්ධන මධ්‍යස්ථානය V. මාලමුල්ල කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය VI. ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ගැට්ටුවාන VII. ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය, පොල්පිතිගම VIII. ජාතික මානසික සෞඛ්‍ය සභාව - සහනය	1,964,150.00
08.	ආබාධ සහිත පුද්ගලයන් සඳහා මූල්‍යාධාර ලබා දීම 1. විශේෂ වැසිකිලි ආධාර - 87 2. විශේෂ ව්‍යාපෘති - 01 3. වෘත්තීය පුහුණුව නිමකළ ස්වයංරැකියා නිරත පුද්ගලයන් සඳහා ආධාර ලබා දීම - 09	4,013,475.00
වියදම් එකතුව		**27,648,804.73**
වෙන් කළ ප්‍රතිපාදන		**28,000,000.00**

ආබාධ සහිත වූවන්ගේ සුබසාධන හා සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන තවත් එක් ව්‍යාපෘතියක් වන්නේ ශ්‍රව්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා සේවා සැපයීමයි. මේ යටතේ දෙපාර්තමේන්තුගත සංඥා භාෂා පරිවර්තක නිලධාරීන් මගින් දිවයින පුරා වෙසෙන ශ්‍රව්‍යාබාධ සහිත පුද්ගලයන් සඳහා සංඥා භාෂා පරිවර්තක සේවය ලබා දීම සිදු කෙරෙන අතර, ශ්‍රව්‍යාබාධ සහිත පුද්ගලයන් සඳහා හැඳුනුම්පත් ලබා දීමද සිදු කරයි. 2021 වර්ෂයේ ශ්‍රව්‍යාබාධිත හැඳුනුම්පත් 47ක් නිකුත් කර ඇත.

ආබාධ සහිත වූවන්ගේ සුභසාධන වැඩසටහන භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය 216-02-03-13 – 1501 (2021/12/31 දිනට)

අනු අංකය	ක්‍රියාකාරකම හා භෞතික ප්‍රගතිය	ප්‍රතිපාදන රු.	වියදම රු.
01.	දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල ආබාධ සහිත අභ්‍යාසලාභීන් 344 ක් සඳහා අභ්‍යාසලාභී දීමනා ගෙවීම (එක් ළමයෙකුට රු. 150/-)	14,925,000.00	9,539,600.00
02.	දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා ආයතනවල සේවාලාභීන් 45 ක් සඳහා දීමනා ගෙවීම		

ආබාධ සහිත වූවන්ගේ සුභසාධන වැඩසටහන - මූල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය 216-02-03 – 1203 (2021/12/31 දිනට)

අනු අංකය	ක්‍රියාකාරකම්	ප්‍රතිපාදන රු.	වියදම රු.
01	වෘත්තීය පුහුණු ආයතන වල ආහාර සඳහා ගෙවීම් කිරීම හා නිවාස පාලක,උපස්ථායක නිලධාරීන් සඳහා නිළ ඇඳුම් දීමනා ගෙවීම	28,000,000.00	26,956,306.22

2.1.5 ආබාධ සහිත දරු දැරියන්ගේ ක්‍රීඩා, සංස්කෘතික හා කලා කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය

සමාජ සේවා දෙපාර්තමේන්තුව ආබාධ සහිත දරු දැරියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම සිදු කරන අතරම ඔවුන් සතු සෞන්දර්යාත්මක හා ක්‍රීඩා කුසලතාවයන් ඔප්නංවා සෞඛ්‍ය සම්පන්න ක්‍රියාශීලී පුද්ගලයන් ලෙස සමාජගත කිරීම සඳහා ද මූලික වී කටයුතු සිදු කරයි. ඒ සඳහා දිවයිනේ සියලුම ආබාධිත තරුණ තරුණියන් නියෝජනය වන පරිදි ඔවුන්ගේ ක්‍රීඩා හා කලා කුසලතාවන් දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගෙන සෑම වසරකම ජාතික ක්‍රීඩා හා කලා ප්‍රසංග පැවැත්වීම සිදු කරනු ලබයි. දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් පවත්වන ලද තරඟ වලින් ජයග්‍රහණය කරන පුද්ගලයින් හා කණ්ඩායම් ජාතික මට්ටමේ තරග සඳහා යොමු කිරීමත් ඉන් අනතුරුව ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග, සම්මාන හා සහතික පත් පිරිනැමීමත් සිදු කෙරේ.

ශ්‍රී ලාංකීය සංස්කෘතික සිරිත් විරිත් පිළිබඳ සජීවී අත්දැකීම් විඳගැනීමේ අවස්ථාව ආබාධ සහිත දරුවන්ට ලබා දීම, සෙසු අය මෙන් මොවුන්ගේ ක්‍රීඩාව සහ නර්තනය කෙරෙහි තිබෙන හැකියාව ඔප් නැංවීම, ආබාධිත ප්‍රජාව පිළිබඳ සමාජයේ තිබෙන පාරම්පරික සාවද්‍ය ආකල්ප වෙනස් කිරීම හා ඔවුන් සමාජ පිළිගැනීමට ලක්කිරීම මෙම වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ. මේ යටතේ ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන ජාතික වැඩ සටහන් 03 කි.

i. ආබාධ සහිත දරු දැරියන්ගේ ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය - ‘‘සිත් රූ’’
ii. ආබාධ සහිත වූවන්ගේ ජාතික ආධුනික මලල ක්‍රීඩා උළෙල
iii. ආබාධ සහිත දරුවන්ගේ බක්මහ උළෙල

COVID 19 වසංගතය හේතුවෙන් ජනතාව ඒකරාශී කොට සිදුකරන උත්සව හා වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය හා ආරක්ෂක අංශ වෙතින් පනවනු ලැබූ සීමාකම් හේතුවෙන් ආබාධ සහිත දරුවන්, දෙමව්පියන් හා නිලධාරීන් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් යුතුව පවත්වනු ලබන ආබාධ සහිත තැනැත්තන්ගේ ජාතික මලල ක්‍රීඩා උළෙල හා ‘‘සිත් රූ’’ කලා ප්‍රසංගය 2021 වර්ෂයේ ද පැවැත්වීමට හැකියාව නොලැබුණු නමුත්, ආබාධ සහිත දරුවන් සඳහා වන බක්මහ උළෙල, ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හා වෘත්තීය පුහුණු ආයතන මට්ටමින් පවත්වන ලදි.

2.1.6 ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩ සටහන (සී. බී. ආර්.)

ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික ප්‍රතිපත්තියට අනුව, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් වගකීම් හා යුතුකම් ඉටු කිරීමට හැකිවනු පිණිස ඔවුන් දැනුමෙන් හා කුසලතාවලින් සවිබලගැන්වීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. එසේම එම ප්‍රජාවගේ පවුල්වල සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජයීය යහපැවැත්ම තහවුරු කිරීමේ විවිධ වැඩසටහන් ද මේ යටතේ ක්‍රියාත්මක වේ.

ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන - මූල්‍ය හා භෞතික ප්‍රගතිය

වැය ශීර්ෂය 216 -02 -03 -5 – 2509 (2021/12/31 දිනට)

ව්‍යාපෘතිය	වැඩසටහන	භෞතික ප්‍රගතිය	ඇස්තමේන්තුව රු.මිලියන	වියදම රු.මිලියන
ප්‍රජා මූලික පුනරුත්තාපන වැඩසටහන (සී.බී.ආර්)	බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ස්වශක්ති සංවිධාන ඇගයීම - "ස්වාභිමානී" ජාතික සම්මාන ප්‍රදානය	2019 හා 2020 වර්ෂ දෙක සඳහා සම්මාන ප්‍රදානය කරන ලදි.	3.479	3.05
	ආබාධිත ප්‍රජාව සඳහා සෘජු ආධාර ලබාදීම • කොමඩ් වැසිකිලි • විදුලි බල පහසුකම් • ප්‍රවේශ මාර්ග පහසුකම් • වායු මෙට්ට ලබා දීම • ජල මේට්ට ලබාදීම • ජල පහසුකම් • වෙනත් උපකරණ හා ආධාර	සෘජු ආධාර - 142	1.871	1.89
	දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රගති සමාලෝචන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	වැඩසටහන් - 1181	1.36	1.299
	රෝහල් සුබසාධක වැඩසටහන්	වැඩසටහන් 864 ප්‍රතිලාභීන් 1799	0.2	0.063
	නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්	පුහුණු වැඩසටහන් 04	0.1	0.155
	ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන/ සාකච්ඡා ප්‍රධාන කාර්යාලය	ප්‍රගති සමාලෝචන රැස්වීම් 04	0.1	0.033
	පරිපාලන වියදම්	සී.බී.ආර්. අංශයේ දුරකථන බිල්පත්, ලිපිද්‍රව්‍ය,ඉන්ධන හා අනෙකුත් පොදු වියදම්	0.1	0.1
	කාලීන අවශ්‍යතා සඳහා නිර්මාණාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	වැඩසටහන් - 48	3.79	2.45
එකතුව			**11.0**	**9.04**

2.1.7 දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම අරමුණු කරගනිමින්, දිවයින පුරා විසිරී සිටින දෘශ්‍යාබාධිත ප්‍රජාවට හා ඔවුන්ගේ පවුල්වල සුභසාධනය උදෙසා විවිධ වැඩසටහන් මේ යටතේ සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය තුළ සැළසුම් කරන ලද වැඩසටහන්වලින් බොහොමයක් එපරිද්දෙන්ම සිදු කිරීමට හැකියාව ලැබුන ද කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පනවන ලද සීමා කිරීම් හේතුවෙන් සමහර වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. එකී අභියෝග මධ්‍යයේ වුව ද සිදු කරන ලද වැඩසටහන් හා ඊට අදාළ ක්‍රියාකාරකම් තුළින් ඉහළ මට්ටමේ භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට හැකියාව ලැබිණි.

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය හා භෞතික ප්‍රගතිය

වැය ශීර්ෂය 216-02-03-3-1508 (2021/12/31 දිනට)

අනු අංකය	වැඩසටහන	භෞතික ප්‍රගතිය	ඇස්තමේන්තුව රු	වියදම රු
01	ක්‍රීඩා ආධාර	05	12,000.00	12,000.00
02	වෘත්තීය පුහුණුව	05	350,000.00	157,000.00
03	**අධ්‍යාපන හා සංස්කෘතික ආධාර**		8,124,945.00	7,500,555.00
	I. දෘශ්‍යාබාධිත පාසල් සිසුන් සහ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම	381		
	II. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා ජංගම දුරකථන ලබාදීම (ඩේසි රෙකෝඩර් වෙනුවට)	49		
	III. කාලය සඟරාව සඳහා ආධාර ලබාදීම(කලාප)	12		
04	**පුනරුත්ථාපන ආධාර**		1,336,661.50	1,184,311.50
	I. කථන ග්‍රන්ථ	පිටු 24000		
	II. ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය වෙත බ්‍රේල් රයිටර් ලබාදීම	02		
	III. දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා සංගීත උපකරණ ලබාදීම	01		
	IV. දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා ස්වයංරැකියා ආධාර ලබාදීම	15		
	V. දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ නිවාස සඳහා විදුලිබලය ලබාදීම	01		
	VI. ශ්‍රී ලංකා අන්ධජන සේවා මණ්ඩලය වෙත උපකරණ ලබාදීම	ජල පෙරණ - 01 පිරිසි කුට්ටම් -24		
05	අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර	අක්ෂි කාච - 03	116,293.50	46,950.00
06	විගණන ගාස්තු		156,000.00	156,000.00
07	මූල්‍ය වියදම්		25,000.00	6,830.00
08	විවිධ වියදම්		29,100.00	26,980.00
09	පරිපාලන වියදම්		500,000.00	494,725.50

2.2 මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ ව්‍යාපෘතිය

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම , සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතිය හරහා හෙරොයින්, ගංජා, කේරළ ගංජා, මද්‍යසාර, මත්පෙති හා වෙනත් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් ආයතන ගත කර පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සිදු කෙරේ.

ආයතනයට ඇතුළත් වීමෙන් පසු ප්‍රධාන වශයෙන්ම සිදු කෙරෙනුයේ මනෝ චිකිත්සක, මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමවේදයන් හා වෛද්‍ය විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු කිරීමයි. එම කාලය තුළ සේවාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා යෝගී ව්‍යායාම භාවනා හා ආගමික වැඩසටහන් පැවැත්වීම සිදු කෙරේ. සේවාලාභීන් පුනරුත්ථාපනය වන කාලය තුළ නේවාසික පහසුකම්, ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයේ. සේවාලාභීන්ගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන වෘත්තීමය හැකියාවන් සංවර්ධනය කිරීමේ පුහුණුවක්ද නේවාසික කාලය තුළ ලබා දෙනු ඇත.

ආයතනගත පුනරුත්ථාපනය සිදු කරන අතරම දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රජා මත් නිවාරණ වැඩසටහන්ද මේ යටතේ සිදු කෙරේ.

2021 වර්ෂය තුළ ජයවිරු සමාධි නිවහන ආයතනයේ පුනරුත්තථාපන සේවය ලබාගැනීම සඳහා විවිධ මත්ද්‍රව්‍ය වලට අබ්බැහි වූ පුද්ගලයින් 139ක් පමණ ආයතනගත වී ඇත. සංඛ්‍යාත්මකව ගත් කළ එය 2020 වර්ෂයට සාපේක්ෂව පුද්ගලයන් 21ක වැඩි වීමකි. ස්වෙච්ඡාවෙන් 117 ක් හා අධිකරණ නියෝග මත 22ක් ලෙස ඇතුලත් වී ඇත. පසුගිය වසර 05 තුළ මෙම ආයතනය හරහා පුනරුත්ථාපනය හා සමාජගත වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු පහත ප්‍රස්ථාර සටහන මගින් දැක්වේ.

පුනරුත්ථාපනය වූ හා සමාජගත වූ පුද්ගල සංඛ්‍යාව - 2017-2021



මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය 216- 02-03-2-1501 – (2021/12/31) දිනට

ක්‍රියාකාරකම	වෙනු වූ ප්‍රතිපාදන (රු)	මූල්‍ය ප්‍රගතිය (රු)	භෞතික ප්‍රගතිය
ප්‍රජා මත් නිවාරණ වැඩසටහන (දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින්)	1,500.000.00	905603.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාල 7 ක තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීම.

2.3 ජයග්‍රහණ

- **මඩකලපුව නව වෘත්තීය පුහුණු ආයතනය විවෘත කිරීම හා පුහුණු පාඨමාලා ආරම්භ කිරීම**

ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා දෙමළ භාෂා මාධ්‍යයෙන් වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කරගනිමින් නැගෙනහිර පළාතේ මඩකලපුව ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ නව වෘත්තීය පුහුණු ආයතනය 2021.12.02 වන දින විවෘත කරන ලද අතර, ඉලෙක්ට්‍රොනික් හා මැහුම් යන පාඨමාලා දෙක යටතේ අභ්‍යාසලාභීන් 40 දෙනෙකු බඳවා ගනිමින් පාඨමාලා කටයුතු ආරම්භ කරන ලදි.

- **තෝලංගමුව අනුබද්ධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය විවෘත කිරීම**

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතන මගින් නේවාසිකව ලබාදිය හැකි පුහුණුව උපරිම සිසුන් හයසීයයකට පමණ සීමාවී ඇති තත්ත්වයක් තුළ සහ නිවසින් දීර්ඝ කාලීනව බැහැර කිරීමට අකමැති ආබාධ සහිත දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ වැඩපිළිවෙල යටතේ එහි ආරම්භක අනුබද්ධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය හා අනුබද්ධ කරමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝලංගමුව අනුබද්ධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ලෙසින් 2021 නොවැම්බර් මස 17 වන දින විවෘත කරමින් තෝරාගත් සිසුන් 17 දෙනෙකු සඳහා බතික් පාඨමාලාව ආරම්භ කරන ලදි.

- **බුද්ධි ඌනතා සහිත අයවළුන් සඳහා වන රැකවරණ මධ්‍යස්ථානය පුළුල් කිරීම/ධාරිතාවය වැඩි කිරීම**

දෙමව්පියන් සහ භාරකරුවන් අහිමි බුද්ධි ඌනතා සහිත පිරිමි අයවළුන් සඳහා රැකවරණය ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන පුවක්පිටිය ජයවිරු සෙවණ ආයතනයේ පවත්නා ධාරිතාවය , දිනෙන් දින ඉහළ යන සේවාලාභී ඉල්ලීම් සඳහා ප්‍රමාණවත් නොවන හෙයින් එහි ධාරිතාවය වැඩි කරමින් තවත් බුද්ධි ඌනතා සහිත පිරිමි ළමුන් 50ක් සඳහා රැකවරණය ලබා දීම අරමුණු කර ගනිමින් ඉදිකරනු ලැබූ පුවක්පිටිය නව දෙමහල් ගොඩනැගිල්ල 2021.04.01 දින විවෘත කරන ලදි. ඒ අනුව එහි මුළු ධාරිතාවය පුද්ගලයින් 130 දෙනෙකු දක්වා ඉහළ දමා ඇත.

- අමුණුකුඹුර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අනුබද්ධිතව දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය සඳහා පුද්ගලයින් 27 කට නවාතැන් ගතහැකි නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් 2021.02.11 දින විවෘත කරන ලදි.

2.4 අභියෝග

- දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතනවලින් පිටවන වෘත්තීය පුහුණුලාභීන් රැකියාගත කිරීම.
- ආබාධ සහිත වූවන් පුනරුත්ථාපනය කිරීමේදී තනි පුද්ගල සංවර්ධන සැලසුම් සකස්කිරීම හා එම සැලසුම් වලට අනුකූලව ක්‍රියාකාරකම් සිදු කිරීම.
- දිගුකාලීනව රැකවරණය අවශ්‍ය ආබාධ සහිත දරුවන් සඳහා ආරක්ෂාව,රැකවරණය ලබා දීම සඳහා ප්‍රමාණවත් සම්පත් හා පහසුකම් නොමැතිවීම.
- රෝහල් සුභසාධන සේවාවන්වල නියුතු නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සැලසීම හා සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම.

2.5 ඉලක්ක

- **හම්බන්තොට දිස්ත්‍රික් ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ආරම්භ කිරීම**

  මුල් ළමාවියේ සිටින ආබාධ සහිත දරුවන් කල්තියා හඳුනාගැනීම හා ආබාධ සහිත තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා ක්‍රියා කිරීම වෙනුවෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වන නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ආදර්ශ කොට ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුල් ළමාවියේ පසුවන ආබාධ සහිත දරුවන් වෙනුවෙන් සේවා සැපයීම සඳහා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ‘‘සිතිජය’’ නමින් දිස්ත්‍රික් ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය නවීකරණය කටයුතු අවසන් කර ඇති අතර, 2022 වර්ෂයේ ජනවාරි මස එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට සැලැසුම් කර ඇත.

- **කොට්ටාව කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කිරීම**

  වයස අවුරුදු 13-19ත් අතර සිටින යෞවන යෞවනියන් අනාගතයේ වෘත්තීය පුහුණුව සඳහා යොමු කරවීමට අවශ්‍ය පූර්ව සූදානම් කිරීම අරමුණු කරගනිමින් ඉදිකරනු ලැබූ කොට්ටාව කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය 2022 වර්ෂය තුළ විවෘත කිරීමට සැලසුම් කර ඇත.

- **රියන්සි අලගියවන්න කාන්තා කුසලතා සංවර්ධන හා රැකවරණ ජාතික මධ්‍යස්ථානය ආරම්භ කිරීම.**

  රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටුගම්මන ප්‍රදේශයේ ‘‘රියන්සි අලගියවන්න වෘත්තීය පුහුණු ආයතනය’’ ලෙස පවත්වාගෙන යනු ලැබූ ආයතනය සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන මන්ද මානසික කාන්තාවන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නවීකරණ කටයුතු සිදු කර ඇති අතර, එම ආයතනය 2022 වර්ෂය තුළ තුළ බුද්ධි ඌනතා සහිත කාන්තාවන් 50 දෙනෙකු වෙත රැකවරණය

සැලසීමේ අරමුණෙන් "රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය" නමින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

- **කිලිනොච්චිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම.**

  ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා දෙමළ භාෂා මාධ්‍යයෙන් වෘත්තීය පුහුණුව ලබා දීම අරමුණු කර ගනිමින් ඉදිකරනු ලැබූ කිලිනොච්චිය නව වෘත්තීය පුහුණු ආයතනයේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. දෙවන අදියර යටතේ මුළුතැන්ගෙය හා භෝජනාගාර ගොඩනැගිල්ල, ජල ටැංකිය හා මුර කුටියේ ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. 2022 වර්ෂයේ ආයතනය විවෘත කිරීම හා පාඨමාලා ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

- **නව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 05ක් ආරම්භ කිරීම**

  දරුවන්ගේ ආබාධිත තත්ත්වයන් සඳහා කල්තියා මැදිහත් වෙමින් ඔවුන්ගේ ආබාධ අවම කිරීම අරමුණු කරගනිමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ **නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය** දැනටමත් ක්‍රියාත්මක වේ. මෙම ආයතනය ආදර්ශ කොට ගනිමින් 2022 වසර තුළ තෝරාගත් දිස්ත්‍රික්ක 05ක් තුළ ආබාධ සහිත දරුවන් සඳහා නව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට සැළසුම් කර ඇත.

- සී.බී.ආර් වැඩසටහන මගින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සම්බන්ධීකරණ දායකත්වය යටතේ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් තෝරාගත් ආබාධ සහිත පවුල් දෙක බැගින් ආර්ථික හා සමාජීයීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ව්‍යාපෘතියක් හඳුන්වාදීම.
- වෘත්තීය පුහුණු ආයතනයන්හි වගා නොකළ බිම් කොටස් වගා කිරීම තුළින් භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම.
- ආබාධ සහිත පුද්ගලයන්ගෙන් සමන්විත ස්වශක්ති කණ්ඩායම් වල නිෂ්පාදන අලෙවිය සඳහා වෙළඳපල නිර්මාණය කිරීම.
- වෘත්තීය පුහුණු ආයතනවල ක්‍රියාත්මක වන පාඨමාලා නවීකරණය, නව පාඨමාලා හඳුන්වා දීම හා සේවා යෝජකයන් හා පුහුණුලාභීන් අතර සම්බන්ධීකරණය මගින් ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා රැකියා වෙළඳපොළ පුළුල් කිරීම.

.....

ගණන් දීමේ නිලධාරී

නම:- වන්දන රණවීර ආරච්චි

තනතුර:- සමාජ සේවා අධ්‍යක්ෂ

දිනය:- 2022 .

වන්දන රණවීර ආරච්චි
සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජ සේවා දෙපාර්තමේන්තුව
02 වන මහල, "සෙත්සිරිපාය" II අදියර,
බත්තරමුල්ල.

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්ඒඒ - එෆ්

රු

අයවැය (2020)		සටහන	තත්‍ය 2021	තත්‍ය 2020	
	ආදායම් ලැබීම්		-	-	
	ආදායම් බදු	1	-	-	එස්ඒඒ-1
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
	මුළු ආදායම් ලැබීම්(අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		340,843,000	267,006,000	එස්ඒඒ 3
	තැන්පතු		1,169,486	3,858,409	එස්ඒඒ- 4
	අත්තිකාරම් ගිණුම්		19,227,401	18,059,782	එස්ඒඒ-5
	වෙනත් ලැබීම්		-	-	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**361,239,887**	**288,924,191**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් ආදායම් නොවන ලැබීම් ඇ=(අ)+(ආ)				
	අඩු කළා: වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	

431,950,000	වේතන වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	428,219,961	359,418,082	
148,439,100	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	144,272,394	84,417,974	
58,875,000	සහනාධාර,ප්‍රදාන සහ මාරු කිරීම්	7	51,605,679	40,550,306	එස්ඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	
65,900	වෙනත් පුනරාවර්තන වියදම්	9	65,806	-	
639,330,000	**මුළු පුනරාවර්තන වියදම්(ඇ)**		**624,163,840**	**520,386,362**	
	මූලධන වියදම				
11,970,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	8,134,511	4,906,129	
73,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	58,498,925	81,072,214	
-	ප්‍රාග්ධන මාරුකිරීම	12	-	-	ඒ.සි.ඒ 2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
2,500,000	හැකියා වර්ධනය	14	1,238,180	1,116,173	
12,700,000	වෙනත් මූලධන වියදම්	15	9,095,352	9,104,522	
100,670,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**76,966,968**	**96,199,038**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)				
	තැන්පතු ගෙවීම්		1,219,486	3,883,369	එස්ඒ- 4
	අත්තිකාරම් ගෙවීම්		24,601,679	18,204,418	එස්ඒ 5
	මුළු වියදම උ = (ඇ+ඉ+ඊ) 2019		726,951,974	638,673,187	
-	**දෙසැම්බර් 31 දිනට අඟුම ශේෂය ඌ = (ඇ - උ)**		**(365,712,087)**	**(349,748,996)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - පී

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන		තත්‍ය	
			2021 රු.	**2020** රු .
මූල්‍ය නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ 6		486,304,191	477,614,043
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ 5		58,110,226	52,735,948
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ 3			
මුළු වත්කම්			**544,414,417**	**530,349,991**
ශුද්ධ වත්කම්/ස්කන්ධය				
ශුද්ධ වත්කම්			58,085,226	52,660,948
දේපළ, පිරියත හා උපකරණ සංචිතය			486,304,191	477,614,043
ජංගම වගකීම්				
තැන්පතු ගිණුම්	ඒසීඒ 4		25,000	75,000
අග්‍රිම ශේෂය	ඒසීඒ 3			
මුළු වගකීම්			**544,414,417**	**530,349,991**

පිටු අංක 36 සිට 38 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ අකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 39 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත්, මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
නම: සුනේත්‍රා ගුණවර්ධන
තනතුර: ලේකම්
දිනය:2022.04. 25

.....
ගණන් දීමේ නිලධාරි
නම:චන්දන රණවීර ආරච්චි
තනතුර:සමාජ සේවා අධ්‍යක්ෂ
දිනය:2022.04.25

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
නම:ජේ.ආර් දෙනවක
දිනය:2022.04. 25

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	කත්‍ය	
	2021 රු.	**2020** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ මඟින් එකතුකරන ලද ආදායම්	10,785,902	9,640,540
අග්‍රිම ලැබීම්	340,843,000	267,006,000
අත්තිකාරම් අයකරගැනීම්	19,756,746	20,314,440
තැන්පතු ලැබීම්	1,169,486	3,858,409
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**372,555,134**	**300,819,389**
අඩු කළා - මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	294,472,253	233,382,394
සහනාධාර සහ මාරු කිරීම්	39,145,670	32,336,751
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,322,412	1,096,155
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	24,143,239	20,228,994
තැන්පතු ගෙවීම්	1,219,486	3,883,369
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය(ආ)	**360,303,060**	**290,927,663**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඇ)=(අ)-(ආ)	**12,252,073**	**9,891,726**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම	-	-
අත්තිකාරම් අය කර ගැනීම		

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඇ)		
අඩු කළා - මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	**12,252,073**	**9,891,726**
අත්තිකාරම් ගෙවීම්		
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)	**12,252,073**	**9,891,726**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඊ)=(ඇ)-(ඉ)	**(12,252,073)**	**(9,891,726)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ)=(ඇ)+(ඊ)	**(0)**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය(ඌ)	-	-
අඩුකළා - මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)	**(0)**	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාළ නොවේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාළ නොවේ

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	640,000	639,330	624,164	97.63%
ප්‍රාග්ධන	100,000	100,670	76,967	76.46%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - අදාළ නොවේ

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්වය වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	28,570	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	144,579	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	19,800	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	313,135	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

*දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, එම තක්සේරු වාර්තා ලැබෙන පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කරනු

3.9 විගනකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්එස්ඩබ්/ඩී/එස්එස්ඩී/එෆ්එස්/2021

මගෙ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 ජූලි 15 දින

ගණන්දීමේ නිළධාරී
සමාජ සේවා දෙපාර්තමේන්තුව

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යය සාධනය හා අරමුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම , විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1.6.1.1 (ඉ) ඡේදයේ සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක මූල්‍ය නොවන වත්කම් ශේෂය , මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව රු.430,274,243 ක් වූ අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු **" SA 82"** වාර්තාවට අනුව රු.380,465,465 ක් වූයෙන් රු. 49,808,778 ක වෙනසක් විය.

මූල්‍ය නොවන වත්කම් ශේෂයන්හි ඉහත දැක්වුණු වෙනස්කම් සම්බන්ධයෙන් අංක 2021/02 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.9 ඡේදයේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තු පොත්වල ශේෂයන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයෙහි කේවල ලෙජර් සමඟ සසඳා නිරවුල් කර මූල්‍ය නොවන වත්කම් වල ගිණුම්මය නිවැරදිකාවය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගොඩනැගිලි හා ඉදිකිරීම් , කෙරිගෙන යන වැඩ සඳහා සමාලෝචිත වර්ෂයේදී දැරූ රු.49,691,458 ක් වූ මූලධන වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතන , පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම් සම්පූර්ණ කර ගොඩනැගිලි භාවිතයට ගෙන තිබියදීත්, ඉදිකිරීම් වෙනුවෙන් ඉකුත් වර්ෂවලදී දැරූ පිරිවැය කෙරිගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.එකී ඉදිකිරීම් සම්පූර්ණ කළ ගොඩනැගිලි පිරිවැය හඳුනාගෙන ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ගොඩනැගිලි හා ඉදිකිරීම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳව 2021 දෙසැම්බර් 31 දිනට විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ පිරිවැය හඳුනාගැනීම හා පිරිවැය ගණනය කළ ආකාරය පරීක්ෂා කල නොහැකි විය.

(ඈ)සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.128,579ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මූල්‍ය නොවන වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ දිස්ත්‍රික් කාර්යාල සඳහා මිලදීගෙන තිබුණු රු. 80,080 ක් වූ කාර්යාල උපකරණ මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඊ) වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබුණු අක්කර 33ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම් 05ක් පරිත්‍යාග කර වර්ෂ 10කට වැඩි දීර්ඝ කාලයක් ඉකුත් වී තිබුණ ද, ඒවායේ නීත්‍යානුකූල අයිතිය කහවුරු කර එකී ඉඩම්වල හා එහි ඉදිකර තිබුණු ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කරවාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) වෘත්තීය පුහුණු ආයතන 11ක් ස්ථාපිත කර තිබුණු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබීම හා වටිනාකම තක්සේරු කර නොතිබීම හේතුවෙන් ඉකුත් වර්ෂ 10 කට වැඩි කාලයක් තුල ඉදිකර තිබුණු ගොඩනැගිලි, මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත නොකර ගිණුම්වලින් අත්හැර තිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
හානි පාඩු ලේඛනය .	මු.රෙ.110(1)	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
වාහන ලොග් සටහන් පොත (පොදු 267 ආකෘතිය).	මු.රෙ.1645(අ)	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
ගමන් පිළිබඳ මාසික සාරාංශ (පොදු 268 (අ) ආකෘතිය)	මු.රෙ.1646	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
උප පත්‍රිකා පොත් ලේඛනය	මු.රෙ.341	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
විදුලි උපකරණ පිළිබඳ ලේඛනය	මු.රෙ.454(2)	පවත්වා නොතිබුණි.
රජයේ නිලධාරීන්ගේ ඇප ලේඛනය	මු.රෙ.891	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

2021 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුව විසින් මාසිකව ඉල්ලුම් කළ අග්‍රිම වටිනාකම් එකතුව රු.මිලියන 626.07ක් වූ අතර භාණ්ඩාගාරය විසින් වර්ෂය තුළ ලබාදී තිබුණු අග්‍රිම වටිනාකම එකතුව රු.මිලියන 340.84ක් විය.ඉල්ලුම් කළ අග්‍රිම ප්‍රමාණයෙන් රු.285.23ක් එනම් ඉල්ලුම්කළ අග්‍රිමයේ ප්‍රතිශතයක් ලෙස සියයට 45.56ක අග්‍රිම ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවට ලබාදී නොතිබුණි. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණු අතර එය දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 1203,1401,1403,1506,1202 දරන පුනරාවර්තන වැය විෂයන් 05 සඳහා සලසාගෙන තිබුණු වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන එකතුව රු.9,800,000ක් විය. එම වැය විෂයන්ගේ රු.2,135,000ක් වූ එකතුව ප්‍රතිපාදන මු.රෙ.66 මාරු කිරීම මඟින් වෙනත් වැය විෂයන්ට මාරු

කිරීම් සිදුකර තිබියදීත් , එකී වැය විෂයයන් වල ඉතිරිය පිළිවෙලින් සියයට 9 සිට සියයට 54 දක්වා පරාසයක වූ හෙයින් ප්‍රමාණය ඉක්මවා ප්‍රතිපාදන සලසාගෙන තිබුණු බවත් , පුනරාවර්තන වියදම් සඳහා අධි ඇස්තමේන්තුගත කිරීම් සිදුකර තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන වැය විෂයන් 09 ක් සඳහා සලසාගෙන තිබුණු රු.358,200,000 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම් හේතුවෙන් වෙනත් වැය විෂයයන් වලට වෙන්කරගත් රු.42,500,000 ක ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණි. එසේම පුනරාවර්තන වැය විෂයන් 14 ක් සඳහා සළසාගෙන තිබුණු රු.250,350,000 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිවීම් හේතුවෙන් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීම් කරගෙන තිබුණි.

(ඇ) 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් සඳහා වැය විෂය 03 ක් යටතේ හා ඇතුලත් කර නොතිබුණු කාර්යයන් සඳහා වැය විෂය 03ක් යටතේ වෙන්කරගෙන තිබුණු ප්‍රතිපාදන පිළිවෙලින් රු.14,500,000ක් හා රු.800,000ක් විය. එකී වැය විෂයන් 04ක රු.14,700,000ක් වූ ප්‍රතිපාදනයෙන් රු.4,866,444ක් එනම් සියයට 28 සිට සියයට 73ක පරාසයක වූ ප්‍රතිපාදන හා වැය විෂය 02ක රු.600,000ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම එනම් සියයට 100ක ප්‍රතිපාදන 2021 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 3.3 ඡේදය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.94 විධිවිධාන පරිදි එළඹී තිබුණු බැඳීම් හා බැරකම් හෙළිදරව් කළ යුතු වුවත්, වැය විෂයන් 05කට අදාලව 2021 දෙසැම්බර්31 දිනට එළඹී තිබුණු 2,433,292ක් වූ බැරකම් හා බැඳීම් බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ආ) වැය විෂයන් 06කට අදාලව ප්‍රතිපාදන ඉතිරිවීම් එකතුව රු.2,334,751ක් වූ අතර එම වැය විෂයන් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට බැරකම් එකතුව රු.8,249,966 ක් වූයෙන් ප්‍රතිපාදන ඉක්මවූ බැරකම් වටිනාකම රු.5,915,215 ක් විය.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(ඇ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාල සියලුම බැරකම් එම වර්ෂය තුලදී නිදහස් කළයුතු අතර කිසිදු බැරකමක් ඊලඟ වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙනයාමට කටයුතු නොකළ යුතු බව උපදෙස් දී තිබුණ ද, එසේ ගෙවා නිදහස් නොකළ වර්ෂ 01 සිට වර්ෂ 02 දක්වා කාලයක් ඉකුත් වූ වැය විෂයන් 03කට අදාලව රු.32,770ක් වූ බැරකම් පැවති බවත්, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.211 විධිවිධාන කෙරෙහි නිසි අවධානය යොමු වී නොමැති බවත් නිරීක්ෂණය විය.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති , රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මු.රෙ.1646	වාහන භාර නිලධාරී විසින් වාර්තා ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊලඟ මාසයේ 15 වන දිනට පෙර දෙපාර්තමේන්තුවේ වාහන ධාවනය සම්බන්ධයෙන් මාසික සාරාංශ හා ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ii) මු.රෙ.104(3)	දෙපාර්තමේන්තුවේ වෑන් රථයකට අනතුරකින් සිදු වූ අලාභ හානි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(iii) මු.රෙ.757(2)	සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ තුනකදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ

	ඌනතා අතිරික්තතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීමට ඉකුත් වර්ෂ වලදී විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබුණ ද , ඒ පිළිබඳව අවධානය යොමු වී නොතිබුණි.
(ඇ) 2016 පෙබරවාරි 10 දිනැති අංක ඩීඑම්ජේ/එච්ටී/2015/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.2 ඡේදය	දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 05ක කාලය තුලදී වාර්ෂික භෞතික සමීක්ෂණ කටයුතු සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

2.6 අවධිමත් ගනුදෙනු

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදයේ විධිවිධාන පරිදි අදාල නිලධාරීන් හට මසකට රු.1000ක උපරිමයකට යටත්ව දුරකතන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට උපදෙස් ලබාදී තිබුණ ද, ඊට පටහැනිව අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෝහල් ආශ්‍රිතව පිහිටුවා තිබුණු වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල අනුයුක්තව සේවය කරන දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන්ට හා සංවර්ධන නිලධාරීන්ට මාසිකව දුරකතන දීමනාවක් ලෙස රු.1000ක මුදලක් 2020 සැප්තැම්බර් සිට ගෙවා තිබුණි. මේ අනුව 2020 වර්ෂයේදී නිලධාරීන් 238 දෙනෙකුට රු.238,000ක් , 2021 වර්ෂයේදී නිලධාරීන් 391 දෙනෙකුට රු.4,695,000ක් හා 2022 මාර්තු දක්වා නිලධාරීන් 220 දෙනෙකුට රු.660,000ක් ද වශයෙන් එකතුව රු. 5,593,000ක් දුරකතන දීමනා ගෙවා තිබුණි. මේ සඳහා 2020 ජනවාරි 08 හා ජූනි 08 දිනයන්හීදී අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් අනුමැතිය ඉල්ලා තිබුණ ද , ඊට අනුමැතිය ලබාදී නොතිබුණු අතර උක්ත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා උපදෙස් දී තිබුණි.

තව ද, වෘත්තීය පුහුණු ආයතන , ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථාන හා මත්ලෝලී පුහුණු මධ්‍යස්ථාන වල සේවයේ නියුතු දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන් හට මාසිකව රු.1000ක දුරකතන දීමනාවක් ගෙවීමට එවකට හිටපු අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් අනුමැතිය ඉල්ලා තිබුණ ද , එය අනුමත නොකරන බව දැනුම් දී තිබුණි. නමුත් මාසිකව රු.1000ක දුරකතන දීමනාවක් ගෙවීමට හිටපු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත නොකළ තත්ත්වය හෙළිදරව් නොකර හා චක්‍රලේඛ විධිවිධාන නිවැරදි නොවන ලෙස ඉදිරිපත්කර නව පත්වීම් ලද අමාත්‍යාංශ ලේකම්වරියගෙන් මාණ්ඩලික සටහනකින් අනුමැතිය ලබාගෙන 2021 මාර්තු සිට 2022 මාර්තු දක්වා කාලය තුල නිලධාරීන් 31 දෙනෙකුට මාසිකව දුරකතන දීමනා ගෙවීම සඳහා රු.372,000ක වැය කර තිබුණි.

මේ අනුව 2020 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා කාලය තුල එකතුව රු.5,965,000ක් වූ දුරකතන දීමනා ගෙවීම සඳහා විධිමත් අධිකාර බලයක් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

ඊට අමතරව දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් 433 දෙනෙකු සඳහා ඩයලොග් ජංගම දුරකතන සම්බන්ධතා 489ක් 2020 අගෝස්තු මස ලබාදී, දුරකතන ගාස්තු ගෙවීමේ වගකීම දෙපාර්තමේන්තුව භාරගෙන තිබුණි. ඉහත ගෙවන රු.1000ක් වූ දුරකතන දීමනාවෙන් රු.306ක් වූ ජංගම දුරකතන සම්බන්ධතාවල මාසික ස්ථාවර ගාස්තුව පිළිබඳ නිලධාරීන්ගෙන් අයකර ඩයලොග් ආයතනයට ගෙවා තිබුණි. නිලධාරීන් විසින් ලබාගත් දුරකතන ඇමතුම් වෙනුවෙන් අයකළ ගාස්තු රු.530,019ක් හා ගෙවීම් ප්‍රමාදයන් හේතුවෙන් 2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුල අයකළ ප්‍රමාද ගාස්තුව රු.106,898ක් වශයෙන් එකතුව රු.636,917ක් 2021 දෙසැම්බර් 31 දිනට වූ බැරකම් ගෙවීමේ වගකීම අවධිමත් ලෙස දෙපාර්තමේන්තුවට පැවරී තිබුණි.

2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් කාර්යය සඳහා විසර්ජන පනතකින් බලය ලබාදී තිබුණු අවම ලැබීම් සීමාව රු.20,000,000ක් වුවත් , එම සීමාව සමාලෝචිත වර්ෂය තුලදී රු.16,500,000ක් දක්වා අඩුකරගෙන තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ලැබීම් රු.19,000,457ක් දක්වා වර්ධනය වී තිබුණි. කාලානුරූපීව වර්ධනයට සාපේක්ෂව ලැබීම් සීමාව සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හා ඉලක්කගත සීමාව ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් ණය අයකර ගැනීමේ කාර්යක්ෂමතාවය ලැබීම් සීමා පැනවීම තුලින් ඉටු වී නොතිබුණි.

(ආ)සේවා ස්ථාන මාරුවීම , මියයාම, විශ්‍රාම යාම, සේවය හැරයාම යනාදී හේතූන් මත දැනට දෙපාර්තමේන්තුවේ සේවයේ නොමැති නිලධාරීන් හා සේවකයන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.850,460ක් වූ හිඟහිටි සේවක ණය ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05කට වැඩි කාලයක් දක්වා ඉකුත් වී තිබුණ ද අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට හෝ ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 ජූනි 16 දින සිට 2021 සැප්තැම්බර් 15 දින දක්වා කාලය තුල බැංකු ගිණුමට තැන්පත් කර තිබුණු එකතුව වටිනාකම රු.25,244 ක් වූ චෙක්පත් 09ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් උප ලබ්ධි වී නොතිබුණු අතර එම චෙක්පත් වටිනාකම් ගිණුමට බැර නොවූ තැන්පතු ලෙස බැංකු සැසඳුමේ දක්වා තිබුණි. මාස 03 සිට මාස 18 දක්වා දීර්ඝ කාල පරාසයක් ඉකුත් වී තිබුණ නමුත් , උපලබ්ධි වී නොතිබුණු එකී චෙක්පත් වටිනාකම අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හා ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 31 දින සිට 2021 දෙසැම්බර් 29 දින දක්වා මාස 17ක කාලය තුල බැංකු ගිණුමට බැර වූ එකතුව වටිනාකම රු.60,767ක සෘජු තැන්පතු 21ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.396 (ඇ) විධිවිධාන ප්‍රකාරව කල් ඉකුත් වූ චෙක්පත් අවලංගුකර ගෙවීමට ඇති මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුව තිබුණ ද වටිනාකම රු.270,766.90ක් වූ මාස 06කට වැඩි කාලයක් කල් ඉකුත් වූ චෙක්පත් 08ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වූ 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර පිළියෙල කර ප්‍රධාන ගණුන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම එදිනට පිළියෙල කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි දෙපාර්තමේන්තුවේ පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සැලසුම් කිරීමට අවධානය යොමු වී නොතිබුණි.

- ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු අවම කිරීම සඳහා මැදිහත්වීම හා ඔවුන් සවිබල ගැන්වීම.
- සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය
- මතට ඇබ්බැහිවූවන් නේවාසික පුනරුත්ථාපනය කිරීම , ඔවුනට ව්‍යක්තිය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.
- විවිධ සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම.

3.1.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

ප්‍රාථමික සෞඛ්‍ය සේවා , වසංගත රෝග , කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය සමඟ ගිවිසුම්ගත වී ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණු ආබාධ සහිත වූවන්ගේ රැකියා පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම සඳහා දෙපාර්තමේන්තුවට වෙන්කළ වාර්ෂික ප්‍රතිපාදන අවධිමත් ලෙස උපයෝජනය කර රු.660,690ක වියදම් දරා තිබුණි. අංක 1401 හා1403 දරන ප්‍රවාහන, විදුලිය හා ජලය වැය විෂයන්ට වෙන්කළ

ප්‍රතිපාදන මු.රෙ.66 විධිවිධාන උපයෝගී කර ප්‍රතිපාදන මාරු කිරීම් මගින් මේ සඳහා ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් ආරම්භකර තිබුණු ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන ජාතික වැඩසටහන යටතේ ජාතික මෙහෙයුම් කමිටු ඉකුත් මාස 27ක කාලය තුලදී අක්‍රීය කර තිබීම , සමාජසේවා වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම, ආබාධ සහිත පුද්ගලයන්ගේ නිෂ්පාදන ප්‍රමිතිගත කිරීම හා වෙළඳපොළ හඳුන්වාදීම යනාදී කාර්යයන් ඉටුකර නොතිබීම හේතුවෙන් ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවර්ධනය , අධ්‍යාපනය, ආර්ථික හා සමාජීය අංශයන් කෙරෙහි ජාතික මට්ටමින් හිතකර තීරණ ගැනීමට අපොහොසත් වීම,වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය දුර්වලවීම, ආබාධ සහිත පුද්ගලයන්ගේ නිෂ්පාදන හඳුනාගැනීම , ප්‍රමිතිගත කිරීම, පුහුණුව ලබාදීම, ප්‍රමිති නිෂ්පාදන තෝරාගැනීම හා නිෂ්පාදන ජාතික මට්ටමට ඉදිරිපත් කිරීම යනාදි අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගෙන නොතිබුණි. තව ද , ප්‍රජාමූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට රු.12,500,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද , ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල බල ප්‍රදේශ 25 සඳහා ප්‍රතිපාදන නිදහස්කර තිබුණේ රු.7,703,248ක් පමණි. ඉතිරි රු.4,796,752ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එසේම නිදහස්කල ප්‍රතිපාදන වලින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීම හා සමාලෝචනය කිරීමට ද අපොහොසත් වී තිබුණි.

(ආ) පුවක්පිටිය ජයවිරු සෙවණ රැකවරණ මධ්‍යස්ථානය හා ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය ස්ථාපිත කර තිබුණු භූමියේ මන්ද මානසික කාන්තාවන්ගේ රැකවරණය උදෙසා රැකවරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 35ක් හා 2019 වර්ෂයේදී රු.මිලියන 40ක් වශයෙන් එකතුව රු.මිලියන 75ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. සලසාගත් ප්‍රතිපාදනයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් සඳහා උපයෝජනය කර තිබුණේ රු.මිලියන 44.18ක් පමණි. රු.මිලියන 30.82ක් වූ ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හා ඉදිකිරීම් කටයුතු වල ප්‍රමාදය හේතුවෙන් 2020 වර්ෂයේදී නැවතත් රු.මිලියන 9.98ක් ප්‍රතිපාදන සලසාගෙන ඉන් රු.මිලියන 8.78ක් උපයෝජනය කර තිබුණි. උල්පත් ජලය ඉවත් කිරීම සඳහා කාණු පද්ධතිය, වැසිකිළි පද්ධතිය , පානීය ජලය ලබාගැනීමේ ළිඳ හා ජල ටැංකිය, මුළුතැන්ගෙය යනාදී වැඩ විෂයන් II අදියර යටතේ ඉදිකිරීමට සැලසුම්කර තිබුණ ද , රු.මිලියන 1.14ක් වැයකර ජල ටැංකිය පමණක් ඉදිකර තිබුණි. තව ද ගෘහ භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 2.65ක් ද වැයකර තිබුණි. භූ විෂමතාවය අනුව වර්ෂා කාලයේදී ජල උල්පත් හේතුවෙන් වැසිකිලි උතුරා යාම , ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ නොකිරීම, ඉදිකිරීම් කටයුතු වල ප්‍රමාදයන් , මතට ඇඹැහි වූ තරුණයන් රඳවා සිටීම , ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය පිහිටුවා තිබීම හේතුවෙන් මන්ද මානසික කාන්තාවන්ගේ

ආරක්ෂාවට තර්ජනයක් පැවතීම මත ඉදිකළ ගොඩනැගිල්ලේ මන්ද මානසික කාන්තා රැකවරණ මධ්‍යස්ථානය ආරම්භ නොකර අත්හැර දමා තිබුණි. ව්‍යාපෘතියේ හා එහි කටයුතු සැලසුම් කිරීමේ අඩුපාඩු හේතු වී තිබුණු බවත් , රු.මිලියන 54.48ක් වැයකර ඉදිකළ ගොඩනැගිල්ල හා රු.මිලියන 2.13ක් වැයකර මිලදී ගත් ගෘහ භාණ්ඩ වර්ෂ 02ක පමණ කාලයක් නිශ්කාර්යව තිබුණු අතර, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගෙන නොතිබුණි.

3.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුල් ළමාවියේ පසුවන ආබාධ සහිත දරුවන් කල්තියා හඳුනාගැනීම හා ආබාධ තත්ත්වයන් මහහරවා කුසලතා වර්ධනය කිරීම සඳහා සේවා සැපයීම වෙනුවෙන් හම්බන්තොට ''සිතිජය'' ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කිරීම ඉලක්කගත කර තිබුණ ද , එය ආරම්භ කිරීමට 2022 වර්ෂයට කල්දමා තිබුණි.

(ආ) අවුරුදු 13-19 වයසේ පසුවන තරුණ , තරුණියන්ගේ ඉදිරි වෘත්තීය පුහුණු කටයුතු සඳහා පූර්ව සූදානම් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කිරීමට ඉලක්කගත කර තිබුණු කොට්ටාව කුසලතා සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී සම්පූර්ණ කර තිබුණ ද , එහි පුහුණු කටයුතු සමාලෝචිත වර්ෂයේදී ආරම්භ නොකර 2022 වර්ෂය දක්වා කල්දමා තිබුණි.

(ඇ) උතුරු - නැගෙනහිර පලාත්වන ආබාධ සහිත තරුණ, තරුණියන් සඳහා දෙමළ භාෂා මාධ්‍යයෙන් වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා 2017 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කළ කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු 2022 අප්‍රේල් 30 දින වන විටත් නිමකර නොතිබුණි. මේ හේතුවෙන් ඉලක්කගත පරිදි සමාලෝචිත වර්ෂයේදී වෘත්තීය පුහුණු කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

3.1.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ දැක්ම අනුව 2030 වර්ෂය වන විට ඉලක්කගත ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා වූ අපේක්ෂිත ඉලක්කය වෙත ලඟාවීමේ ප්‍රගතිය හා කාර්යසාධනය පිළිබඳව කාර්යය සාධන වාර්තාවේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් ප්‍රජාවගේ ස්වාභාවය, ප්‍රමාණය හා ඔවුන් භූගෝලීය වශයෙන් විසිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන, වාර්ෂිකව ඊට අලුතින් එකතුවන ප්‍රමාණයන් පිළිබඳ ඇස්තමේන්තුගත දත්ත, දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන විසින් වාර්ෂිකව සවිබලගන්වනු ලබන ප්‍රජාව පිළිබඳ සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන , දත්ත හා තොරතුරු විශ්ලේෂණාත්මකව කාර්යසාධන වාර්තාවෙන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) අරමුණු සාක්ෂාත් කරගැනීම පිළිබඳ ප්‍රගතිය (outcome) වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වනු වෙනුවට කල ප්‍රතිදානයන් (output) කාර්යසාධන ප්‍රගතිය වශයෙන් දක්වා තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

2020 අගෝස්තු 22 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුවේ විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර පිළියෙල කළයුතු වුවත් පිළියෙල කර තිබුණේ මාස 02ක් කල්ඉකුත් වී 2021 පෙබරවාරි 15 දින දීය. තවද පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අනුමැතිය ලබාගැනීමට හා එසේ අනුමත කළ ප්‍රසම්පාදන සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ද කටයුතු කල යුතුව තිබුණ ද , එසේ කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.756 විධිවිධාන ප්‍රකාරව 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2022 මාර්තු 31 දින වනවිට ඉටුකර තිබුණ ද , මු.රෙ.757 විධිවිධාන ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් ඌනතා , අතිරික්තතා හා අපහරණයන් පිළිබඳව සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂ 03කට අදාල සමීක්ෂණ මණ්ඩල නිර්දේශයන් ක්‍රියාත්මක කර පොත් හා ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුය මඟින් ප්‍රකාශිත පිරිවැය රු.290,998ක් වූ පොත් , සඟරා හා පත්‍රිකා වර්ග 07ක පිටපත් 22,460ක් වර්ෂ 05කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

(ඇ) වෘත්තීය පුහුණු ආයතනවල පුස්තකාලය සඳහා 2019 වර්ෂයේදී රු.130,815කට මිලදීගත් කාව්‍ය ග්‍රන්ථ, පරිවර්තන කෘති, නවකතා යනාදී පොත් 288ක් පුස්තකාලවල පරිහරණය සඳහා නිකුත් කිරීමෙන් තොරව වර්ෂ 02කට වැඩි කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රේ.880 විධිවිධාන පරිදි රජයේ මුදල් හා වත්කම් සම්බන්ධ කටයුතු කරන භාරය හා වගකීම දරණ රාජ්‍ය නිලධාරීන්ගෙන් ඇප අයකරගත යුතුව තිබුණ ද,දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු , ඇප අයකරගත යුතු බවට හඳුනාගෙන තිබුණු නිලධාරීන් 40 දෙනෙකු අතුරින් ඇප අයකරගෙන තිබුණේ නිලධාරීන් 06 දෙනෙකුගෙන් පමණි. මේ සඳහා කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දුර්වල තත්ත්වයක් පැවතුණි. තව ද මුදල් රෙගුලාසි 892 විධිවිධාන ප්‍රකාරව පොදු 183 ආකෘතිය පරිදි සෑම වර්ෂ 03ක් අවසානයේදී ඇප තැබීමට අවශ්‍ය සියලුම නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාව හා තවදුරටත් ඇප තැබීමට අවශ්‍ය නොවන නිලධාරීන් පිළිබඳව විස්තර ඇතුලත් ප්‍රතිශෝධිත වාර්තාව පිලියෙළ කිරීම සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන කාර්යාලයේ වාහනයකට අනතුරකින් සිදු වූ රු.68,850ක ඇස්තමේන්තුගත අලාභහානිය පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. එකී අලාභහානි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104(1) විධිවිධාන ප්‍රකාරව පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු අතර අලාභහානි වාර්තා කිරීමට ද කටයුතු කර නොතිබුණි .

(ආ) සීදුව වෘත්තීය පුහුණු ආයතනයේ සමාලෝචිත වර්ෂයේදී සිදුකළ සොරකමකින් අස්ථානගත වූ වටිනාකම රු.50,000ක් වූ රූපවාහිනී යන්ත්‍රය සම්බන්ධයෙන් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) රාගම වෘත්තීය පුහුණු ආයතනයේ ඉකුත් වර්ෂයේදී සිදුකර තිබුණු සොරකමින් වටිනාකම රු.70,800ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අයිතම 06ක් අස්ථානගත වී තිබුණි. එකී අලාභය පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අතර මු.රෙ.104 විධිවිධාන ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු ක්‍රියාත්මක කිරීමට ද පියවර ගෙන නොතිබුණි.

(ඈ) භාවිතයට නොගෙන දෙපාර්තමේන්තු ප්‍රධාන ගබඩාවේ වර්ෂ 03 සිට වර්ෂ 08 දීර්ඝ කාලයක් ගබඩා කර තිබුණු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය අයිතම 24ක් කල්ඉකුත් වීම හා විනාශ වීම හේතුවෙන් හානියට පත් වී තිබුණි. හානි වූ තොග සම්බන්ධයෙන් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. එකී තොග හානි ගණනය කර මුදල් රෙගුලාසි 108 විධිවිධාන පරිදි පොත්වලින් කපා හැරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 02ක පමණ කාලයක් ධාවනයෙන් ඉවත්කර අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනයේ ගාල්කර තිබුණු වෑන් රථයක් 2018.03.19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර චක්‌කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ උපදෙස් පරිදි 2018 වර්ෂයේදී අපහරණයට කිරීමට තීරණය කර තිබුණ ද , එකී වෑන් රථය අලුත්වැඩියා කර භාවිතා කිරීමට සුදුසු බව 2019 වර්ෂයේදී තීරණය කර , වර්ෂ 03ක පමණ කාලයක් අලුත්වැඩියා නොකර ගාල්කර තිබුණු අතර , අලුත්වැඩියා කටයුතු සිදුකර තිබුණේ 2020 වර්ෂයේදීය. රු.320,020ක වියදමක් දරා අලුත්වැඩියා කටයුතු සිදුකර තිබුණ ද , 2022 අප්‍රේල් 30 දින වන විටත් වෑන් රථය ධාවනයට සුදුසු තත්ත්වයට පත්කිරීමට අපොහොසත් වී තිබුණි. වර්ෂ 05ක පමණ දීර්ඝ කාලයක් ධාවනය නොකර ගාල්කර තැබීම හේතුවෙන් අමතර වශයෙන් එන්ජිම අලුත්වැඩියා කිරීමටද සිදුවී ඇති බව නිරීක්ෂණය විය. මේ නිසා අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් දැරූ වියදම ඵලදායීතාවක්ද ලැබී නොතිබුණි.

(ආ) "කොවිඩ් 19 " රෝග වසංගත තත්ත්වය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතන වල පුහුණුව ලබන අභ්‍යාසලාභීන් වෙත ලබාදෙන සිසු ආහාර වෙනුවට වියළි ආහාර සලාකයක් ලෙස වියළි ආහාර මල්ලක් අභ්‍යාසලාභීන් 129 දෙනෙකුට රු.5000 බැගින් හා අභ්‍යාසලාභීන් 71 දෙනෙකුට රු.2,000 බැගින් ලබාදීම සඳහා රු.787,000ක් වැයකර තිබුණි. එකී ආහාර සලාක මල්ල අදාල අභ්‍යාසලාභීන් විසින් නිසිලෙස භාරගත් බවට තහවුරු කරගෙන නොතිබීම , වියළි ආහාර සලාක මල්ල නිසිකලට ලබාදී නොතිබීම, ඒ පිළිබඳ පසුවිපරම් කටයුතු කිරීම,කාර්යය සාධන වාර්තා ලබා නොගැනීම් හා කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පිළිවෙත් හඳුන්වාදී නොතිබීම නිරීක්ෂණය විය.

(ඇ) සමාජ සේවා දෙපාර්තමේන්තුව සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ පැවතියදී අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුවට 2019 සැප්තැම්බර් 08 දින පැවරීම් කර ලබාදී තිබුණු කැබරථයක් වර්ෂ 02ක පමණ කාලයක් ධාවනයේ නොයොදයවා තිබියදී ප්‍රජා පොලිස් සේවා රාජ්‍යඅමාත්‍යාංශයේ ඉල්ලීම හා අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි එකී රාජ්‍ය අමාත්‍යාංශයට 2021 සැප්තැම්බර් 15 දින පැවරුම්කර භාරදී තිබුණි. දෙපාර්තමේන්තුවේ රාජකාරී අවශ්‍යතාවයක් සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් නොතිබීම හා වාහන වල හිඟ තත්ත්වය තුල කැබරථයේ සිදුකළ යුතු අලුත්වැඩියා කටයුතු සිදුකර ධාවනයේ යෙදීමට අවධානය යොමු නොකර වෙනත් අමාත්‍යාංශයකට පැවරීම සිදුකරන අවස්ථාවේ දෙපාර්තමේන්තුවේ වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයට වාහනයක අවශ්‍යතාවය දැනුම් දී තිබුණද ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනයට ලබාදී තිබුණු යතුරු පැදියක් අලුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් 2021 ජනවාරි සිට ධාවනයට යොදවා නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඉ) 1956 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 65ක කාලය තුල ස්ථාපිත කර තිබුණු ඍත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 14ක ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ඉතා දීර්ඝ කාලයක් ගතවී තිබුණද අපොහොසත් වී තිබුණි. එම ඉඩම් වලින් ඉඩම් 07ක් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව දැක්වුණ ද , එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණු අතර පරිහරණය සඳහා භුක්තිය පමණක් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ඉඩම් වල වටිනාකම තක්සේරු කර ගැනීම , මැනුම් කටයුතු කිරීම හා මානක සැලසුම් පිළියෙල කර ගැනීම යනාදී පවරා ගැනීම් සඳහා වූ මූලික කටයුතු හෝ ඉටුකරගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් අංක 04/2018 හා 02/2019 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ වලින් හඳුන්වාදී තිබුණු මාර්ගෝපදේශයන් කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය ප්‍රමාණාත්මක ලෙස යොමු වී නොතිබුණි. තව ද විධිමත් ලෙස නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමෙන් තොරව ගොඩනැගිලි ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා ඉකුත් වර්ෂ 05 කාලය තුල රු.මිලියන 500කට අධික රජයේ මුදල් වැයකර තිබුණි.

(ඊ) සමාජ සේවා නිලධාරී තනතුරු වල පුරප්පාඩු සඳහා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කළ තත්ත්වය තුලදී සංවර්ධන නිලධාරීන් 23 දෙනෙකු හට සමාජ සේවා නිලධාරී තනතුරුවල වැඩ බැලීම හෝ රාජකාරී ආවරණය කිරීම වෙනුවෙන් දීර්ඝ කාලීනව පත්කර දිමනා වශයෙන් රු.867,153ක් ගෙවා තිබුණි. සමාජසේවා නිලධාරී තනතුරු වල අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් බඳවාගෙන නිලධාරීන්ගේ අතිරික්තයක් පැවතියදී , අතිරික්තව සිටින සංවර්ධන නිලධාරීන් සමාජසේවා නිලධාරී කටයුතු වල අනුයුක්ත කරනු වෙනුවට වැඩ බැලීම හෝ රාජකාරී ආවරණය කිරීමට පත්කිරීම තුලින් වියදම් පාලනය ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.

(උ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර තිබුණු සීමාසහිත නාගරික ආයෝජන හා සංවර්ධන (පෞද්ගලික) සමාගමට අයත් සෙත්සිරිපාය II පියවර ගොඩනැගිල්ලේ 2වන මහලේ A හා B පර්යන්ත වල වර්ග අඩි 2500ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ගොඩනැගිලි ඉඩ පහසුකම් සඳහා රු2,654,142ක මාසික බදු කුලියක් යටතේ 2020 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලයට රු.18,578,994ක් හා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට රු.28,064,849ක් වශයෙන් එකතුව රු.46,643,843ක් ගෙවීම් කර තිබුණි. තවද 2020 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව කුලී ගෙවීම් සඳහා අදාල වර්ෂයේදී ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු අතර එකී හිඟ කුලී සමාලෝචිත වර්ෂයේදී ගෙවීම සඳහා අංක 1508 (වෙනත්) දරන වැය විෂයයට වෙන්කළ ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණි. ගොඩනැගිලි කුලියට ගැනීම සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ විධිවිධානයන්ට පටහැනිව කටයුතු කර තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.835(2) (ඇ) විධිවිධාන පරිදි කුලී වටිනාකම තීරණය කිරීම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ කුලී තක්සේරුවක් ලබා ගැනීම ,කුලී ගොඩනැගිලි ලබාගැනීම සඳහා කොවිඩ් පාලන ප්‍රාථමික සෞඛ්‍ය සේවා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීම,

මුදල් රෙගුලාසි 853(3) විධිවිධාන ප්‍රකාරව කුලී ගිවිසුම්වලට එළඹීම හා කුලී ගිවිසුම්වලට එළඹී එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සිදු කර නොතිබුණි. තව ද ගෙවීම් කළ ගොඩනැගිලි කුලී ගාස්තු තුල රු.15,220,140ක සේවා ගාස්තු ඇතුලත් කර තිබුණු අතර එම සේවා ගාස්තු පිළිබඳව සැලකිල්ල යොමුකර , සාධාරණ හා අවම ගොඩනැගිලි කුලියක් නිශ්චය කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

2019 ඔක්තෝබර් 03 දිනැති අංක PS/SP/SB/C/22/2019 දරන ජනාධිපති ලේකම් වක්‍රලේඛයේ ඇමුණුම 2 පරිදි දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර හා ඉලක්කයන් සමඟ තිරසර සංවර්ධන උපායමාර්ග නිසිලෙස අනුගතවී නොමැති බව නිරීක්ෂණය විය.

කෙසේ වෙතත් ආබාධ සහිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණු අවස්ථා සැලසීම හා සියලු අධ්‍යාපන මට්ටම්වලට ප්‍රවිශ්ඨ වීමේ අවස්ථාව තහවුරු කිරීම , 2030 වර්ෂය වන විට ආබාධිත තරුණ තරුණියන් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම , 2030 වර්ෂය වන විට ආබාධිත ප්‍රජාවගේ සමාජ ආර්ථික හා දේශපාලනික , අන්තර්කරණය, සවිබලගැන්වීම සහ ප්‍රවර්ධන යනාදි තිරසර සංවර්ධන අරමුණු 03ක් හා ඒ යටතේ තිරසර සංවර්ධන ඉලක්ක 11ක් හඳුනාගෙන තිබුණි.

4.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) ආබාධ සහිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණු අවස්ථා සැලසීම හා සියලු අධ්‍යාපන මට්ටම්වලට ප්‍රවිශ්ඨ වීමේ අවස්ථාව තහවුරු කිරීම හා ඒ අරමුණු යටතේ වූ සැලසුම් කළ ඉලක්කගත කාර්යයන් 05ක් වෘත්තීය පුහුණු පාඨමාලා නවීකරණය හා NVQ මට්ටමේ සහතිකපත් ලබාදීමේ ඉලක්කය සාක්ෂාත් කරගෙන නොතිබීම හේතුවෙන් එහි ප්‍රගතියක් නොවීය. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ලබාදීම හා කුසලතා වර්ධනය කිරීම, නව වෘත්තීය පුහුණු ආයතන ඉදිකිරීම, මුල් ළමාවියේ පසුවන ආබාධිත සහිත දරුවන්ගේ ආබාධ අවම කිරීමට මැදිහත් වීම යටතේ වූ ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ කාර්යය සාධන ප්‍රගතිය සියයට 60ක සාමාන්‍යය අගයක් විය.

(ආ) 2030 වන විට ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීමේ සංවර්ධන අරමුණ සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වූ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා හෝ ආයතනගත රැකියාවලට යොමු කිරීමේ පුහුණු මහපෙන්වීම් හා සම්බන්ධීකරණ කටයුතු ඉටුකිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු හෙයින් එහි කිසිදු ප්‍රගතියක් නොවීය.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන අභ්‍යන්තර විගණක හා සංවර්ධන නිලධාරී 03 දෙනෙකුගෙන් සමන්විත සීමිත කාර්යය මණ්ඩලයක් මඟින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර තිබුණි.

නවෝත්පාදන ප්‍රවේශයන් මත කඩිනම්, කාර්යක්ෂම හා සඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අපේක්ෂිත ප්‍රතිඵල ලබාකර ගැනීම තුලින් ඉලක්කගත ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සවිබලගැන්වීම සාක්ෂාත් කරගෙන ඇති බව තහවුරු කරගැනීමට සහ ඒ සඳහා මූල්‍ය හා මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම හා අනුගමනය කර ඇති ක්‍රමවේද , පිළිවෙත් හා ප්‍රතිපත්ති යනාදියේ නිවැරදි බව තහවුරු කරගැනීමට අදාල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් 2021 වර්ෂය තුලදී සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය සහ සේවා ඝනයන් යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තථ්‍ය හා පුරප්පාඩු කාර්යය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවා ගණය	අනුමත	තථ්‍ය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	9	8	1
තෘතීයික	491	259	232
ද්විතීයික	170	115	55
ප්‍රාථමික	116	100	16
එකතුව	786	482	304

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා සෘජු ලෙස කටයුතු ක්‍රියාත්මක කරන තෘතීයික සේවා ඝනයේ ස්ථාන භාර නිලධාරී තනතුරු 05ක්, ද්විතීයික සේවා ඝනයේ භාෂා පරිවර්තක, භෞතික චිකිත්සක, වෘත්තීය චිකිත්සක, කථන චිකිත්සක, වැඩ කළමණාකරු, වෘත්තීය උපදේශක , සං,ඥා භාෂා පරිවර්තක, පෙර පාසල් ගුරු, නිවාස පාලක යනාදී තනතුරු 50ක් හා ප්‍රාථමික සේවා ඝනයේ අරක්කැමී, ළමා සංවර්ධන සහයක , අරක්කැමි සහයක , උපස්ථායක යනාදී තනතුරු 06ක් වශයෙන් එකතුව 61ක් පුරප්පාඩු වශයෙන් පැවතිණි. ඉකුත් වර්ෂ 05ක කාලය තුලදීම එම පුරප්පාඩු පිරවීම සඳහා නිසිලෙස කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

පුරප්පාඩු වූ ස්ථාන භාර නිලධාරී තනතුරු 05ක් පිරවීම සඳහා 2020 වර්ෂයේදී අයදුම්පත් කැඳවා කටයුතු ආරම්භකර තිබුණ ද , බඳවාගැනීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී සිදුවී තිබුණු දීර්ඝ කාල ප්‍රමාදයන් හේතුවෙන් මෙතෙක් බඳවාගැනීමට අපොහොසත්ව තිබුණි.

(ආ) තෘතියික සේවා ඝනයේ සමාජ සේවා නිලධාරී තනතුරු 225ක පුරප්පාඩු පැවති අතර එය අනුමත කාර්යය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස සියයට 47ක් විය. නිලධාරීන් විශ්‍රාම යාම මත දීර්ඝ කාලයක සිට සමුච්චිත වී තිබුණු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදුකිරීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණු අතර පුරප්පාඩු වූ තනතුරු වල රාජකාරී ඉටුකිරීම සඳහා අවධිමත් ලෙස සංවර්ධන නිලධාරීන් තාවකාලිකව සේවයේ යොදවා තිබුණි.

(ඇ) අනුමත කාර්යය මණ්ඩලයේ නොවන සංවර්ධන නිලධාරී (සමාජ සේවා) තනතුරු සඳහා ඉකුත් වර්ෂ වල බඳවාගෙන තිබුණු සංවර්ධන නිලධාරීන් 200 දෙනෙකු සමාජ සේවා නිලධාරී තනතුරු වල රාජකාරී ඉටුකරන තත්ත්වය තුල වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී විෂය රාජකාරී සඳහා තවත් සංවර්ධන නිලධාරීන් 137 දෙනෙකු බඳවාගෙන එම තනතුරු අනුමත කාර්යය මණ්ඩලයේ නොමැති වීම මත සමාජ සේවා නිලධාරී විෂය රාජකාරී සඳහාම නැවත පත්වීම් ලබාදී තිබුණි. මේ හේතුවෙන් 480ක් වූ සමාජ සේවා නිලධාරී අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 112 දෙනෙකුගේ සේවක අතිරික්තයක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත සංවර්ධන නිලධාරීන් බඳවාගැනීම් සිදුකලේනම් අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීම කළයුතුව තිබුණත් එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත බඳවාගත් සංවර්ධන නිලධාරීන් ඵලදායී ලෙස සේවයෙහි නියුක්ත කිරීමට අවධානය යොමුකොට අනුමත සේවක සංඛ්‍යාව නොඉක්මවන ලෙස සමාජසේවා නිලධාරීන්ගේ විෂය කටයුතු ඉටුකිරීමට සංවර්ධන නිලධාරීන් විධිමත් පරිදි අනුයුක්ත කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ නිසි සැලකිල්ල යොමු වී නොතිබුණි. කෙසේ වෙතත් සමාජ සේවා නිලධාරීන්ගේ විෂයය කටයුතු සංවර්ධන නිලධාරීන් විසින් ඉටුකිරීම තනතුරු හා සේවා ව්‍යවස්ථාවන් අතර ප්‍රශ්න සහගත තත්ත්වයන් ඇතිවන බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ඉ) ද්විතියික සේවා ඝනය යටතේ වූ වෘත්තීය උපදේශක තනතුරු 09ක් හා ප්‍රාථමික සේවා ඝනය යටතේ වූ පුනරුත්ථාපන සහයක තනතුරු 09ක් සඳහා අවධිමත් ලෙස කොන්ත්‍රාත් පදනම මත කෙටිකාලීනව බඳවාගැනීමට අනුමැතිය ලබාගෙන තිබුණි. වර්ෂ 05කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද , සේවයේ අවශ්‍යතාවය මත එම තනතුරු ස්ථිර කාර්යය මණ්ඩල යටතේ අනුමත ක්‍රගැනීමට පියවර ගෙන නොතිබුණි. තවද , 2021 දෙසැම්බර් 31 වන දිනට වෘත්තීය උපදේශක තනතුරු 07ක් හා පුනරුත්ථාපන සහයක තනතුරු 05ක් පුරප්පාඩු වී පැවතුණි.

20

මේ අනුව ද්විතියික , තෘතීයික , ප්‍රාථමික සේවා ඝනවල පවතින පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමට කටයුතු සලසාගෙන නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

කේ.සී.පී.සේනාරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

ආයතනයේ කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% - 100%	75% - 89%	50% - 74%
02. ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධ වැඩසටහන යටතේ සහභාගී වූ ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව			√
03. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල යටතේ ප්‍රතිලාභ ලැබූ දෘශ්‍යාබාධිත පුද්ගල සංඛ්‍යාව		√	
04. වෘත්තීය පුහුණුව ලබන ආබාධ සහිත ආබාධ සහිත තරුණ තරුණියන් හා ස්වේච්ඡා ආයතනවල සේවාලාභීන් සඳහා දෛනික දීමනා ලබාදුන් සංඛ්‍යාව			√
05. ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (සී.බී.ආර්) යටතේ පුනරුත්ථාපනය වූ / ප්‍රතිලාභ ලැබූ ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව	√		
05. කිලිනොච්චිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම			√
06. මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම	√		
07. පුවක්පිටිය බුද්ධි ඌනතා සහිත අයවළුන් සඳහා වන රැකවරණ මධ්‍යස්ථානය ඉදිකිරීම			√
08. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන යටතේ පවත්වන ලද පුහුණු සංඛ්‍යාව	√		

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු (SDG)

හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	ප්‍රතිශතය		
			0 – 49%	50 – 74%	75 – 100%
4.5 ආබාධ සහිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම හා අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම.	වයස අවුරුදු 16-35 අතර වයසේ සිටින ආබාධ සහිත පුද්ගලයන් 665ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා කුසලතා සංවර්ධනය කිරීම	වෘත්තීය පුහුණුව නිමකල ආබාධ සහිත තරුණ තරුණියන් සංඛ්‍යාව - 344		√	
	වෘත්තීය පුහුණු පාඨමාලා නවීකරණ කිරීම හා NVQ මට්ටමේ සහතික පත්‍ර ලබාදීම- 30	NVQ මට්ටම ලබාගත් පාඨමාලා සංඛ්‍යාව - 07	√		
	වෘත්තීය පුහුණුව සාර්ථකව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් කට්ටල ලබා දීම 191	මෙවලම් කට්ටල ලබාදුන් අභ්‍යාසලාභීන් සංඛ්‍යාව- 190			√
	අළුතින් ඉදිකරන ලද නව වෘත්තීය පුහුණු ආයතන 02ක් විවෘත කිරීම	විවෘත කරන ලද නව වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව- 01		√	
	මුල් ළමා වියේ පසුවන ආබාධ සහිත දරුවන් 150 දෙනෙකුගේ ආබාධ අවම කිරීම සඳහා මැදිහත් වීම	ආබාධිත තත්වයන් අවම කිරීම සඳහා මැදිහත් වූ ආබාධ සහිත ළමුන් සංඛ්‍යාව - 93		√	
8.5 **2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයන් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම**	රැකියා අපේක්ෂිත ආබාධ සහිත පුද්ගලයින් සඳහා ස්වයංරැකියා හෝ ආයතනගත රැකියා සඳහා යොමු වීමට අවශ්‍ය පුහුණු මගපෙන්වීම හා සම්බන්ධීකරණය	රැකියාගත වූ හා ස්වයංරැකියා සඳහා යොමු වූ හා පහසුකම් සැලසූ සංඛ්‍යාව - 257		√	

10.2 **2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිත බව, ජන වර්ගය ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ ආර්ථික හා දේශපාලනික අන්තර්කරණය සවිබලගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම**	දෙමව්පියන් සහ භාරකරුවන් අභිමි බුද්ධි ඌනතා සහිත අයවළුන් 75 දෙනෙකු සඳහා රැකවරණය ලබාදීම	රැකවරණය ලබාදුන් ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව - 76			√
	ආබාධ සහිත පුද්ගලයන් සඳහා ඉදිකරන ලද නව රැකවරණ මධ්‍යස්ථානය විවෘත කිරීම	විවෘත කරන ලද නව රැකවරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව- 01			√
	මතට ඇබ්බැහි වූවන් 170ක් පුනරුත්තාපනය කිරීම හා සමාජගත කිරීම	පුනරුත්ථාපනය කරන ලද මත්ලෝලීන් සංඛ්‍යාව - 139			√
	දෘශ්‍යාබාධ සහිත පුද්ගලයන් 468 ක් සඳහා පහසුකම් සැපයීම	පහසුකම් සපයන ලද දෘශ්‍යාබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව-424			√
	ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන යටතේ ආබාධ සහිත ප්‍රජාව සවිබලගැන්වීම සෘජු ආධාර - 133 විශේෂ ව්‍යාපෘති - 55	සවිබල ගැන්වූ සංඛ්‍යාව සෘජු ආධාර - 142 විශේෂ ව්‍යාපෘති - 48			√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සිය ප්‍රතිපාදනයන්ට යටත්ව තිරසර සංවර්ධන ඉලක්ක 02ක් යටතේ වාර්ෂිකව ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් සකස් කරනු ලබයි. එලෙස 2021 වර්ෂය තුළ ද සැලසුම් කරන ලද බොහොමයක් වැඩසටහන් තුළින් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට හැකියාව ලැබුණ මුත්, සමහර වැඩසටහන් තුළින් අපේක්ෂිත ජයග්‍රහණ මට්ටම කරා ලඟාවීමට බාධා එල්ල විය.

Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් පනවන ලද සීමාකම් යටතේ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ආයතන සැලකිය යුතු කාලසීමාවක් වසා තැබීමට සිදුවීම හා අවම කාර්ය මණ්ඩලයක් යටතේ රාජකාරී කිරීමට සිදුවීම හේතුවෙන් ඉලක්කගත ජයග්‍රහණ මට්ටම් කරා ළඟාවීමට නොහැකි වුවද සැලකිය යුතු මට්ටමේ ජයග්‍රහණයක් ළඟාකර ගැනීමට හැකියාව ලැබිණි.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	09	08	01
තෘතීයික	491	259	*46
ද්විතියික	576	462	*68
ප්‍රාථමික	125	105	20

* තෘතියික මට්ටමට ඇතුළත් සමාජ සේවා නිලධාරි තනතුරු 480 ක් අනුමත වුවද එම තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කළ හැකි වනුයේ, MN 4 වැටුප් බණ්ඩයේ සමාජ සංවර්ධන සහකාර තනතුරු දරන්නන් සමාජ සේවා නිලධාරි තනතුරට බඳවා ගැනීමෙනුත්, දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති සංවර්ධන නිලධාරි තනතුරු අහෝසි වී ගිය පසුවත්ය.

* එසේම ද්විතියික මට්ටමට ඇතුළත් MN 4 වැටුප් බණ්ඩයේ සමාජ සංවර්ධන සහකාර තනතුරු පුරප්පාඩු නොපිරවීමට යටත්ව හා සංවර්ධන නිලධාරි තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් එම තනතුරු වල ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරීමටද හැකියාවක් නොමැත. එබැවින් තෘතීයික හා ද්විතියික මට්ටමට අදාළව සත්‍ය ලෙසම පවතින ඇබෑර්තු සංඛ්‍යාව මෙහි දක්වා ඇත.

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 2021-12-31

තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කලය රා.ප.ව 03/2016	අනුමත සංඛ්‍යාව	දැනට සිටින	පුරප්පාඩු
අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.	I	SL 1	1	1	0
අතිරේක අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.	I	SL 1	1	1	0
ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී. ලං.ග. සේ.	I	SL 1	1	1	0
ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී. ලං.ග.සේ.	I	SL 1	1	1	0
ගණකාධිකාරී	ශ්‍රී. ලං.ග.සේ.	II/ III	SL 1	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලං ප. සේ.	II/ III	SL 1	3	2	1
සමාජ සුභසාධන අධිකාරී	දෙපාර්තමේන්තුගත	I /II/ III	SL 1	1	1	0
පරිපාලන නිලධාරි	රා.ක.සේ.නි (අධි)	අධි ශ්‍රේණිය	MN 7	1	0	1

ස්ථානභාර නිලධාරි	දෙපාර්තමේන්තුගත	විශේෂ	MN 7	10	4	5
සමාජ සේවා නිලධාරි	දෙපාර්තමේන්තුගත	I /II	MN 5	480	255	40
සමාජ සංවර්ධන සහකාර *	ආශ්‍රිත සේවා	I /II/ III	MN 4	200	1	
සංවර්ධන නිලධාරි (සමාජ සේවා) **	සං. නි. සේවය	I /II/ III	MN 4	184	200	
සංවර්ධන නිලධාරි (වැඩිහිටි)			MN 4		137	
දෘශ්‍යාබාධිත සංවර්ධන නිලධාරි ***	දෙපාර්තමේන්තුගත		MN 4	13	7	6
ආධුනික භාෂා පරිවර්තක	ආශ්‍රිත සේවා		MN 4	1	0	1
භෞත චිකිත්සක	පරිපූරක වෛද්‍ය සේවය	I /II/ III	MT 6	1	0	1
වෘත්තීය චිකිත්සක	පරිපූරක වෛද්‍ය සේවය	I /II/ III	MT 6	1	0	1
කථන චිකිත්සක	දෙපාර්තමේන්තුගත	I /II/ III	MT 6	1	0	1
වැඩ කළමනාකරු	දෙපාර්තමේන්තුගත	I /II/ III	MT 3	5	0	5
වෘත්තීය උපදේශක	දෙපාර්තමේන්තුගත	I /II/ III	MT 1	65	48	17
වෘත්තීය උපදේශක	කොන්ත්‍රාත්			9	2	7
තොරතුරු හා සන්නිවේදන හා තාක්ෂණ සහකාර	ශ්‍රී.ල.තො.ස.තා.ස. සේ.	I /II/ III	MT 1	1	1	0
කළමනාකරණ සේවා නිලධාරී	කළමනාකරණ සේ.නි	I /II/ III	MN 2	48	43	5
සංඥා භාෂා පරිවර්තක	දෙපාර්තමේන්තුගත	I /II/ III	MN 2	26	6	20
පෙර පාසල් ගුරු	දෙපාර්තමේන්තුගත	I /II/ III	MN 1	3	3	0
නිවාස පාලක	දෙපාර්තමේන්තුගත	I /II/ III	MN 1	18	14	4
රියදුරු	රියදුරු සේවය	I /II/ III	PL 3	13	11	2
අරක්කැමි	දෙපාර්තමේන්තුගත	I /II/ III/special	PL 2	9	5	4
ළමා සංවර්ධන සහායක	දෙපාර්තමේන්තුගත	I /II/ III/special	PL 1	5	5	0
අරක්කැමි සහයක	දෙපාර්තමේන්තුගත	I /II/ III/special	PL 1	15	13	2
උපස්ථායක	දෙපාර්තමේන්තුගත	I /II/ III/special	PL 1	32	32	0
කාර්යාල කාර්ය සහයක	කා.කා.සේ.	I /II/ III/special	PL 1	42	34	8
පුනරුත්ථාපන සහයක	කොන්ත්‍රාත්		PL 1	9	5	4
එකතුව				**1201**	**834**	**135**

* පුරප්පාඩු නොපිරවීමට යටත්ව

** දරන්නාට පෞද්ගලික වනසේ පසුව අහෝසි වීමට යටත්ව

*** සවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වෙමින් පවතී

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය/අතිරික්තය බලපා ඇති අකාරය

සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඇතුලත සමස්තයක් ලෙස පවතිනුයේ කාර්ය මණ්ඩල හිඟයක් වේ. එසේ වුවත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් සමාජ සේවා දෙපාරත්මේන්තුව සඳහා අනුයුක්ත කිරීම හේතුවෙන් සංවර්ධන නිලධාරී තනතුරුවල අතිරික්තයක් පවතී. එසේ වුවද එම පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ රාජකාරී කටයුතු කිරීම වෙනුවෙන් අනුයුක්ත කර තිබීම හේතුවෙන් අනුමත

කාර්ය මණ්ඩලය තුළ අතිරික්තයක් පැවතිය ද ඔවුන් වෙතින් සිදු කරනු ලබන කාර්යභාරය තුළ ඵලදායීව මානව සම්පත ප්‍රයෝජනයට ගෙන ඇත.

කොවිඩ් වසංගතය හේතුවෙන් රාජ්‍ය වියදම් සීමා කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලය තුළ පවතින බොහෝ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි විය. එබැවින් පවතින මානව සම්පත සේවා අවශ්‍යතාවය අනුව සාධාරණව ව්‍යාප්ත කරමින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම මගින් අපේක්ෂිත කාර්ය සාධන මට්ටම කරා ළඟාවීමට මෙහෙයවන ලදි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු)	වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමවුම/ලබාගත් දැනුම
මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම යාවත් කාලීන කිරීමේ පුහුණුව (මාර්ගගත පුහුණු)	36	දින 01	25,987.50	දේශීය	මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම යාවත් කාලීන වීම
ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති පිළිබඳ දැනුම යාවත් කාලීන කිරීමේ පුහුණුව (මාර්ගගත පුහුණු)	24	දින 01	22,725.00	දේශීය	ආයතන සංග්‍රහය පිළිබඳ දැනුම යාවත් කාලීන වීම
ඵලදායීතා සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුව	40	දින 01	10,013.50	දේශීය	ආයතනය තුළ ඵලදායීතා සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම
රජයේ විනය කාර්යය පරිපාටිය (මාර්ගගත පුහුණු)	1	දින 03	5,000.00	දේශීය	රජයේ විනය කාර්යය පරිපාටිය පිළිබඳ දැනුම
ගබඩා කළමනාකරණ, ඉන්වෙන්ට්‍රි පාලනය භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් කළමනාකරණය (මාර්ගගත ක්‍රමය)	41	දින 01	37,786.12	දේශීය	ගබඩා , ඉන්වෙන්ට්‍රි පාලනය,භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් කළමනාකරණය පිළිබඳ දැනුම
සමාජ සුභසාධන ප්‍රතිපත්ති හා පරිපාලනය(භෞතිකව නිලධාරීන් 21 හා මාර්තගත ක්‍රමය මගින් නිලධාරීන් 169)	190	දින 01	14,330.50	දේශීය	සමාජ සුභසාධන ප්‍රතිපත්ති පිළිබඳ දැනුම
‘‘කාර්යාල කාර්යය සහායක සේවයේ නිලධාරීන්ගේ කාර්යභාරය හා ආකල්ප සංවර්ධනය’’ පිළිබඳ පුහුණුව (මාර්ගගත ක්‍රමය)	27	දින 01	31,387.50	දේශීය	ආකල්ප සංවර්ධනය
ව්‍යාපෘති වාර්තා සකස් කිරීම (සිංහල මාධ්‍ය) (මාර්ගගත ක්‍රමය)	57	දින 01	29,700.00	දේශීය	ව්‍යාපෘති වාර්තා සැකසීම පිළිබඳ දැනුම - සිංහල මාධ්‍ය
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව (මාර්ගගත ක්‍රමය)	62	පැය 06	31,050.00	දේශීය	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු)	වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමවුම/ලබාගත් දැනුම
ව්‍යාපෘති වාර්තා සකස් කිරීම (දමිළ මාධ්‍ය-මාර්ගගත ක්‍රමය)	47	දින 01	28,350.00	දේශීය	ව්‍යාපෘති වාර්තා සැකසීම පිළිබඳ දැනුම - දමිළ මාධ්‍ය
ව්‍යාපාර සැළසුම්කරණය (සිංහල මාධ්‍ය)-වැඩමුළුව-01 (මාර්ගගත ක්‍රමය)	60	දින 01	29,700.00	දේශීය	ව්‍යාපාරයක් සැලසුම් කිරීම පිළිබඳ දැනුම - සිංහල මාධ්‍ය
Master of Public Management (MPM) Programme 2020-2022 - එන්.ජී.පී.ජී.සමරවික්‍රම මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	1	අවු 02	343,500.00	දේශීය	රාජ්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම
ව්‍යාපාර සැළසුම්කරණය (දමිළ මාධ්‍ය-මාර්ගගත ක්‍රමය)	47	දින 01	28,350.00	දේශීය	ව්‍යාපාරයක් සැලසුම් කිරීම පිළිබඳ දැනුම - සිංහල /දමිළ මාධ්‍ය
ව්‍යාපාර සැළසුම්කරණය (සිංහල මාධ්‍ය)-වැඩමුළු-02 (මාර්ගගත ක්‍රමය)	60	දින 01	29,7000.00	දේශීය	
Formal Letter Writing Skills (මාර්ගගත ක්‍රමය)	7	දින 03	35,000.00	දේශීය	ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලිපි ලිවීම සම්බන්ධ දැනම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම සම්බන්ධ පුහුණුව (මාර්ගගත ක්‍රමය)	10	දින 01	50,000.00	දේශීය	රජයේ වැටුප් සැකසීම සම්බන්ධ දැනුම
Ms-Acess (Online)	1	දින 01	2,000.00	දේශීය	පරිගණක දැනුම
Advanced Ms-Excel Skills (Online)	3	දින 02	10,500.00	දේශීය	පරිගණක දැනුම
රජයේ ඉඩම් අත්පත්කර ගැනීම (මාර්ගගත ක්‍රමය)	20	දින 01	28,845.00	දේශීය	රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුම
ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන	60	පැය 04	18,480.00	දේශීය	නිලධාරීන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය
අත්තිකාරම් බී ගිණුම (මාර්ගගත ක්‍රමය)	1	දින 01	3,750.00	දේශීය	ගිණුම් කටයුතු පිළිබඳ දැනුම
සමාජ විද්‍යා පශ්චාත් උපාධිය - ඉරෝෂා උදයංගනී මිය - සංවර්ධන නිලධාරී (දෙවන අදියර)	1	අවු 01	25,000.00	දේශීය	සමාජ විද්‍යා විෂය පිළිබඳ දැනුම
සමාජ විද්‍යා පශ්චාත් උපාධිය රසිකා වෙල්ගම මිය - සංවර්ධන නිලධාරී (දෙවන අදියර)	1	අවු 01	25,000.00	දේශීය	සමාජ විද්‍යා විෂය පිළිබඳ දැනුම
උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - එස්.ඩබ්.එම්.එම්.එම්.සේමසිංහ මයා (සංවර්ධන නිලධාරී - මහකුඹුක්කඩවල ප්‍රා/ලේ) (දෙවන අදියර)	1	අවු 02	25,000.00	දේශීය	උපදේශනය පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු)	වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමවුම/ලබාගත් දැනුම
පරිගණක පුහුණු (මාර්ගගත) - (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා)	60	දින 03	77,737.50	දේශීය	පරිගණක දැනුම
පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පුහුණුව (මාර්ගගත ක්‍රමය)	60	දින 01	36,450.00	දේශීය	පර්යේෂණ පත්‍රිකාවක් සැකසීම පිළිබඳ දැනුම
සේවාරම්භක පුහුණු - වෘ.උපදේශක,නිවාස පාලක, පෙර පාසල් ගුරු (මාර්ගගත ක්‍රමය)	12	මාස 03	36,600.00	දේශීය	වෘත්තීය පුහුණු ආයතනවල කාර්යන් පිළිබඳ හා ඉගෙනුම් ක්‍රම පිළිබඳ දැනුම
පරිගණක පුහුණු (මාර්ගගත) - වෘත්තීය පුහුණු ආයතන නිලධාරීන් සඳහා	60	දින 03	77,737.50	දේශීය	පරිගණක දැනුම
මූලික ප්‍රථමාධාර පුහුණුව - පුවක්පිටිය ආයතනයේ නිලධාරීන් සඳහා	26	දින 01	25,500.00	දේශීය	මූලික ප්‍රථමාධාර ලබාදෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ දැනුම
ආයතනික සංවර්ධනය සඳහා කාර්ය මණ්ඩල දායකත්වය ප්‍රවර්ධනය කිරීමේ දෙදින වැඩමුළුව	15	දින 02	93000.00	දේශීය	නායකත්ව කුසලතා වර්ධනය කිරීම
සංඥා භාෂා පුහුණු - මාතලේ දිස්ත්‍රික්කය	15	දින 05	රාජ්‍ය නොවන සංවිධානයක මූල්‍ය දායකත්වය යටතේ	දේශීය	සංඥා භාෂාව පිළිබඳ පුහුණුව
සංඥා භාෂා පුහුණු - අනුරාධපුර දිස්ත්‍රික්කය	17	මාස 06		දේශීය	සංඥා භාෂාව පිළිබඳ පුහුණුව
Online Training Programme on Cyber Security	166	පැය 06	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) මූල්‍ය දායකත්වය	දේශීය	සයිබර් ආරක්ෂණය පිළිබඳ දැනුම ලබා ගැනීම
Online Training on Child Disabilities	235	පැය 09	MJF Charitable Foundation ආයතනයේ මූල්‍ය දායකත්වය	දේශීය	ආබාධ සහිත ළමුන් හඳුනාගැනීම හා එම ළමුන්ගේ ආබාධ මගහරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග, ළමා සංවර්ධනය පිළිබඳ දැනුම
Jica Knowledge Co-creation Programme capacity Develpoment of Leaders with disabilities for (UNCRPD) Japan (Online)	01	දින 24		විදේශීය	ආබාධ සහිත පුද්ගලයන්ගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ දැනුම
Online Training on Empowering Persons with disabilities and special needs (Singapore)	01	දින 05		විදේශීය	විශේෂ අවශ්‍යතා සහිත සහ අබාධ සහිත ප්‍රජාව බලගැන්වීම සඳහා වන දැනුම
JICA ECCP Online Programme Intellectural and Development disabilities in Cmmunity Activities	02	දින 08		විදේශීය	අන්තර්කරණය තුළින් ආබාධ සහිත පුද්ගල සංවර්ධනය සිදුකරන ආකාරය පිළිබඳ දැනුම

6.3.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් වල දායකත්වය

සමාජ සේවා දෙපාර්තමේනතුව යටතේ නිලධාරීන් 800කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ආයතන මට්ටමින් ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික තලය දක්වා සිය කාර්යභාරයන් ඉටුකරනු ලබයි.

මෙම නිලධාරීන් තුළින් වඩා ප්‍රසස්ථ සේවාවක් ප්‍රජාව වෙත ලබා ගැනීමට නම් ඔවුන් සතු දැනුම ,කුසලතා ආකල්ප යාවත්කාලීනවීමක් අනිවාර්යෙන්ම සිදු විය යුතු අතර, ඒ සඳහා නිරන්තර පුහුණු කිරීම් අත්‍යාවශ්‍ය වේ. මේ හරහා දෙපාර්තමේන්තු කාර්ය සාධනය ද ඉහළ මට්ටමකට ගෙන ආ හැකි වේ.

2021 වර්ෂයේ ජාතික අය වැය මගින් ලබා දී තිබූ ප්‍රතිපාදනයන්ට යටත්ව දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි වසර මුල පුහුණු වැඩසටහන් සැලසුම් කළ ද පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් හා සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශයනට අනුකූලව නිලධාරීන් එක්රැස් කර ගනිමින් වැඩසටහන් සිදු කිරීම සීමා කිරීම හේතුවෙන් භෞතිකව සිදු කිරීමට සැලසුම් කළ සමහර වැඩසටහන් එම කාලය තුළ පැවැත්වීමට නොහැකි විය. එකී බාධක හමුවේ වුව ද නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා නිවසේ සිට රාජකාරී කරනු ලැබූ නිලධාරීන් ද සම්බන්ධ කර ගනිමින් බහුතර නිලධාරී පිරිසකගෙන් සහභාගීත්වයෙන් මාරගගත ක්‍රමය (Online) උපයෝගී කර ගනිමින් පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

7.1 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	මූල්‍ය ප්‍රකාශ චක්‍රලේඛණයෙන් අනිවාර්ය කර නොමැත	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
03	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මුල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම			
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මූදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/ 1- 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	තොරතුරු සපයා ගැනීමේ කටයුතු සඳහා කල්ගත වීම	ලිඛිත හා වාචික උපදෙස් ලබා දීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු වේ අංක DMA/AMC/N/ 2021/2 හා 2021.08.06 දිනැති ලිපිය අනුව කමිටු රැස්වීම් වාර 04ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල නොවේ	ඇතැම් අවස්ථා වලදී පාලනය කළ නොහැකි වීම	
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීම මත	කාර්ය මණ්ඩලය ඉක්මවා සේවය කරන සංවර්ධන නිලධාරීන්ගේ නාම ලේඛණයක් හා මු.රෙ. 71 අයදුම්පත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර කාර්ය මණ්ඩලය තුළ අතිරික්ත සංවර්ධන නිලධාරී තනතුරු අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.	2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		